අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය


Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ගිණුම්කරණය

ඇගයීම් වාර්තාව - අ.පොස.(උ.පෙළ) විභාගය - 2012

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස
පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ
ව්‍යාපෘතිය (TSEP-WB) මගින්

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2012 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 196 954ක් පාසල් අයදුම්කරුවෝ ද 10 954ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ගිණුම්කරණය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ගිණුම්කරණය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2012 විභාගයේ ගිණුම්කරණය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් මුද්‍රණය කර දුන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 දෙසැම්බර් 01 දින
බත්තරමුල්ල, පැලවත්ත
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ
පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ දී ය.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	ඉසුරු උෂාන් වීරසිංහ සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
		මහාචාර්ය ඩී.එස්.එන්.පී. සේනාරත්න අධ්‍යයනාංශ ප්‍රධාන ගණකාධිකරණ අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
		ඩබ්ලිව්. හිලරි ඊ සිල්වා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගණකාධිකරණ අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
		පී.ඩී.සී. උදය ශාන්ත කථිකාචාර්ය ගණකාධිකරණ අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
සැකසුම් කමිටුව	:	ඩබ්ලිව්.ඇම්. ප්‍රේමණී ප්‍රනාන්දු සාන්ත පීතර විදුහල බම්බලපිටිය.
		එන්.එම්. නිමල් කරුණාතිලක හලා/ආනන්ද ජාතික පාසල හලාවත.
		අයි.ඩී. ප්‍රේමතිලක ගා/කරන්දෙණිය මධ්‍ය විද්‍යාලය කරන්දෙණිය.
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1 විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 8
2.1.2. I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න 9
2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14
2.1.4. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21
2.1.6. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය ප්‍රතිශත ලෙස 22
2.1.7. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය ප්‍රතිශත ලෙස 24

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 25
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, නිරීක්ෂණ, නිගමන හා යෝජනා 26
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 57

III කොටස

3 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 58
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 59

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ගිණුම්කරණය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

* ගිණුම්කරණ සංකල්පීය රාමුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.
* ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ලබාගත් මූලික දැනුම භාවිතයට ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘතව ඇති නව්‍යතා අවබෝධ කර ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා වූ දැනුම විවිධ වෘත්තිය අවශ්‍යතා සඳහා භාවිතයට ගනියි.
* සමාජ ආර්ථික පරිසරයකට ඵලදායි ලෙස කටයුතු කළ හැකි කළමනාකරණ කුසලතා ලබා ගනියි.
* විවිධ ව්‍යාපාර සංවිධානවල ගිණුම් තැබීම පිළිබඳ කුසලතා ලබා ගනියි.
* විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලැබෙන හුරුව අනාගත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායක කර ගනියි.
* සම්පත් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා වර්ධනය කර ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	43497	1396	44893
දෙමළ	6649	370	7019
ඉංග්‍රීසි	1427	409	1836
එකතුව	**51573**	**2175**	**53748**

වගුව 1

1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	11164	21.65	171	7.86	11335	21.09
B	6127	11.88	134	6.16	6261	11.65
C	10499	20.36	295	13.56	10794	20.08
S	11947	23.17	486	22.35	12433	23.13
F	11836	22.94	1089	50.07	12925	24.05
එකතුව	**51573**	**100.00**	**2175**	**100.00**	**53748**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	7825	1877	23.99	856	10.94	1630	20.83	1788	22.85	6151	78.61	1674	21.39
2. ගම්පහ	4814	960	19.94	502	10.43	859	17.84	1121	23.29	3442	71.50	1372	28.50
3. කළුතර	2200	527	23.95	283	12.86	451	20.50	501	22.77	1762	80.09	438	19.91
4. මහනුවර	2575	478	18.56	279	10.83	491	19.07	682	26.49	1930	74.95	645	25.05
5. මාතලේ	687	83	12.08	72	10.48	140	20.38	172	25.04	467	67.98	220	32.02
6. නුවරඑළිය	880	112	12.73	89	10.11	170	19.32	240	27.27	611	69.43	269	30.57
7. ගාල්ල	2160	601	27.82	252	11.67	380	17.59	440	20.37	1673	77.45	487	22.55
8. මාතර	1380	335	24.28	179	12.97	263	19.06	282	20.43	1059	76.74	321	23.26
9. හම්බන්තොට	895	149	16.65	119	13.30	208	23.24	199	22.23	675	75.42	220	24.58
10. යාපනය	813	154	18.94	92	11.32	162	19.93	194	23.86	602	74.05	211	25.95
11. කිලිනොච්චි	105	20	19.05	12	11.43	25	23.81	28	26.67	85	80.95	20	19.05
12. මන්නාරම	171	25	14.62	18	10.53	39	22.81	38	22.22	120	70.18	51	29.82
13. වව්නියාව	234	78	33.33	30	12.82	50	21.37	43	18.38	201	85.90	33	14.10
14. මුලතිව්	79	10	12.66	6	7.59	21	26.58	19	24.05	56	70.89	23	29.11
15. මඩකලපුව	545	159	29.17	58	10.64	102	18.72	119	21.83	438	80.37	107	19.63
16. අම්පාර	833	130	15.61	98	11.76	167	20.05	219	26.29	614	73.71	219	26.29
17. ත්‍රිකුණාමලය	443	76	17.16	49	11.06	76	17.16	117	26.41	318	71.78	125	28.22
18. කුරුණෑගල	2240	433	19.33	256	11.43	448	20.00	478	21.34	1615	72.10	625	27.90
19. පුත්තලම	1074	215	20.02	129	12.01	214	19.93	255	23.74	813	75.70	261	24.30
20. අනුරාධපුරය	1174	171	14.57	142	12.10	264	22.49	309	26.32	886	75.47	288	24.53
21. පොළොන්නරුව	544	85	15.63	62	11.40	90	16.54	129	23.71	366	67.28	178	32.72
22. බදුල්ල	1264	212	16.77	121	9.57	218	17.25	295	23.34	846	66.93	418	33.07
23. මොනරාගල	508	84	16.54	65	12.80	112	22.05	128	25.20	389	76.57	119	23.43
24. රත්නපුරය	1707	466	27.30	222	13.01	336	19.68	354	20.74	1378	80.73	329	19.27
25. කෑගල්ල	1221	259	21.21	127	10.40	261	21.38	262	21.46	909	74.45	312	25.55
සමස්ත දිවයින	**36371**	**7699**	**21.17**	**4118**	**11.32**	**7177**	**19.73**	**8412**	**23.13**	**27238**	**74.89**	**9133**	**25.11**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	1664	3.10	53748	100.00
81 - 90	5332	9.92	52084	96.90
71 - 80	6206	11.55	46752	86.98
61 - 70	6681	12.43	40546	75.44
51 - 60	7501	13.96	33865	63.01
41 - 50	8248	15.35	26364	49.05
31 - 40	7778	14.47	18116	33.71
21 - 30	6242	11.61	10338	19.23
11 - 20	3467	6.45	4096	7.62
01 - 10	619	1.15	629	1.17
00 - 00	10	0.02	10	0.02

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා : මෙම විෂයය සඳහා පෙනී සිටි 53748 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 7778 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 14.47%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 18116ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 33.71%කි.


1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් නොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් නොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා : මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් සිටැරදී ව පිළිතුරු සපයා ඇත්තේ 1 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 89% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් සිටැරදී ව පිළිතුරු සපයා ඇත්තේ 33 ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 18% කි.

1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා අකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි 1 සහ 2 ප්‍රශ්න අනිවාර්ය වුවත් සුළු පිරිසක් එම ප්‍රශ්න දෙක සඳහා ද පිළිතුරු සපයා නැත. අයදුම්කරුවන්ගෙන් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ II පත්‍රයේ 1 ප්‍රශ්නයටය. එම ප්‍රතිශතය 97%ක් පමණ වේ. තෝරා ගන්නා ප්‍රශ්න අතුරින් (3-7 දක්වා) අඩුවෙන් තෝරාගෙන ඇත්තේ 5 ප්‍රශ්නය වන අතර එය 62%කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා අකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16-20 තෙක් ලබාගත් ප්‍රතිශතය 18%කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-5 තෙක් ලබාගත් ප්‍රතිශතය 30%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)



ප්‍රස්තාරය 4 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා : 2 ප්‍රශ්නයේ අ (2) කොටසෙහි පහසුතාව 66%ක් වන අතර, 3 ප්‍රශ්නයේ අ (1) කොටසේ පහසුතාව 93%කි.

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* කාලය පැය 02 යි.
* බහුවරණ ප්‍රශ්න 30ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කි.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
* පිළිතුරු පත් ඇගයීමේදී සෑම ප්‍රශ්නයකට ම ලකුණු 4 බැගින් ලබා දෙනු ඇත. ඒ අනුව මුළු ලකුණු 200 කි.
* අවසාන ලකුණු ගණනය කරන ආකාරය පිළිබඳව 25 පිටුවේ ඇතුළත් වේ.

2.1.2 I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න

1. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
   (1) ආයතනයක සියලු ම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම ය.
   (2) ආයතනයක ගනුදෙනු සටහන් කිරීම, වර්ගකිරීම සහ සාරාංශ කිරීම ය.
   (3) ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම ය.
   (4) ආයතනයක ගනුදෙනුවල සවිස්තරාත්මක විශ්ලේෂණයක් එහි කළමනාකරුවන්ට සැපයීම ය.
   (5) ආයතනයක් පිළිබඳ තොරතුරු, එහි තොරතුරු භාවිත කරන පාර්ශවයන්ට් තීරණ ගැනීම සඳහා සැපයීම ය.

   (.....)

2. පහත දක්වෙන කුමන ගනුදෙනුව ආයතනයක ගැනුම් ජර්නලයෙහි සටහන් කරනු ලබයි ද?
   (1) ණයට මිල දී ගන්නා ලද සියලු ම වත්කම්
   (2) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ගැනුම්
   (3) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ණයට ගැනුම්
   (4) ණයට විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ගැනුම්
   (5) ණයට මිල දී ගන්නා ලද සියලු ම දේපල, පිරියත සහ උපකරණ (.....)

3. ව්‍යාපාරයක් රු. 500 000 ක් වටිනා භාණ්ඩ ණයට විකිණීය. පිරිවිතරවලට එකඟ නොවන්නේයැයි දක්වා ගනුදෙනුකරුවෝ මෙයින් රු. 50 000 ක් වටිනා භාණ්ඩ හරවා එවූහ. පසුව ගනුදෙනුකරුවෝ මුදල් ගෙවා ඉතිරි ශේෂය පියවූහ. මෙම ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලියවිලිවල අනුපිළිවෙළ වන්නේ,
   (1) ඉන්වොයිසිය, හරපත සහ ගෙවීම් වවුචරය (2) ඉන්වොයිසිය, බැරපත සහ ගෙවීම් වවුචරය
   (3) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය සහ ලදුපත (4) ඉන්වොයිසිය, හරපත සහ ලදුපත
   (5) ඉන්වොයිසිය, බැරපත සහ ලදුපත (.....)

4. ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත කාර්යවල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?
   A - මූලික පොත්වල සටහන් තැබීම.
   B - මූලාශ්‍ර ලියවිලි පිළියෙල කිරීම.
   C - ව්‍යාපාර ගනුදෙනු සිදුවීම.
   D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.
   E - ලෙජරයට ගනුදෙනු පිටපත් කිරීම.
   (1) B, D, C, A, E (2) C, B, A, E, D (3) C, B, A, D, E
   (4) C, A, B, E, D (5) D, B, C, A, E (.....)

5. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවලට පදනම් වන උපකල්පන **දෙක** කුමක් ද?
   (1) ඒකක සහ උපචිත (2) ඒකක සහ අඛණ්ඩ පැවැත්ම (3) ඒකක සහ කාලච්ඡේද
   (4) උපචිත සහ අඛණ්ඩ පැවැත්ම (5) කාලච්ඡේද සහ මූල්‍ය මිනුම් (.....)

6. විකුණූ භාණ්ඩවල පිරිවැය, වියදමක් ලෙස ද වර්ෂය අග තොග, වත්කමක් ලෙස ද හඳුනාගැනීම වඩාත් හොඳින් විස්තර කරනුයේ පහත දක්වෙන කුමන ගිණුම්කරණ සංකල්පය ද?
   (1) අඛණ්ඩ පැවැත්ම (2) ඓතිහාසික පිරිවැය (3) ගැළපුම්
   (4) ආරක්ෂණ (5) උපලබ්ධි (.....)

7. සමාගමක් විසින් අවුරුදු 10 කට පෙර ඉඩමක් මිල දී ගත් අතර දැනට එහි සාධාරණ අගය ගැනුම් මිල මෙන් 5 ගුණයක වේ. මෙම ඉඩම එහි සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කළේ නම්, පහත සඳහන් ගිණුම්කරණ තොරතුරුවල කුමන ගුණාත්මක ගති ලක්ෂණය එයින් නිරූපණය කෙරේ ද?
   (1) සැසඳිය හැකි බව (2) අදළ බව (3) විශ්වසනීය බව
   (4) යථාරූපී බව (5) තේරුම් ගත හැකි බව (.....)

8. ආයතනයක් විසින් යන්ත්‍රයක් නඩත්තු කිරීම සඳහා රු. 8 000 ක් ගෙවන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,
   (1) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් අඩුවීම ලෙස ය.
   (2) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් වැඩිවීම ලෙස ය.
   (3) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම අඩුවීම ලෙස ය.
   (4) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම වැඩිවීම ලෙස ය.
   (5) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වත්කම් වැඩිවීම ලෙස ය. (.....)

9. වර්ෂයක් තුළ දී තනි ව්‍යාපාරිකයකුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 500 000 කින් වැඩි විය. පහත සඳහන් කුමන ගනුදෙනුව මෙම වැඩිවීම පෙන්නුම් **නොකෙරේ ද?**
   (1) ව්‍යාපාරය රු. 500 000 ක ලාභයක් ඉපැයීම.
   (2) අයිතිකරු රු. 500 000 ක් නව ප්‍රාග්ධනය ලෙස හඳුන්වා දීම.
   (3) ව්‍යාපාරයේ භාවිතය සඳහා අයිතිකරු ඔහුගේ රු. 500 000 ක් වටිනා මෝටර් වාහනයක් ගෙන ඒම.
   (4) අයිතිකරු ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ඔහුගේ පෞද්ගලික ණයක් වන රු. 500 000 ක් ගෙවීම.
   (5) ව්‍යාපාරයේ සැපයුම්කරුවකුට ගෙවිය යුතු රු. 500 000 ක් අයිතිකරුගේ පෞද්ගලික බැංකු ගිණුමෙන් ගෙවීම.
   (.....)

10. ආයතනයක් එහි සියලු ම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් පවත්වාගෙන යයි. 2012.01.31 දිනට එහි මාසික බැංකු ප්‍රකාශනයෙහි රු. 270 000 ක බැර ශේෂයක්, පෙන්නුම් කරන ලදී. මෙදිනට බැංකුවෙහි තැන්පත් කළමුත් උපලබ්ධි නොවූ චෙක්පත් සහ නිකුත් කළමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් අනුපිළිවෙළින් රු. 85 000 ක් සහ රු. 45 000 ක් විය. 2012.01.31 දිනට ආයතනයේ පොත්වල බැංකු ශේෂය (හර),
   (1) රු. 225 000 (2) රු. 230 000 (3) රු. 270 000
   (4) රු. 310 000 (5) රු. 355 000 (.....)

11. ව්‍යාපාරික ආයතනයක කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙන් පසු පහත දක්වෙන වැරදි අනාවරණය විය.
   (i) ණයගැතියකුගෙන් ලද රු. 18 500 ක මුදලක් රු. 15 800 ක් ලෙස ණයගැති ගිණුමෙහි සටහන් වී ඇත.
   (ii) ණයට විකුණුම් රු. 25 000 ක් රු. 2 500 ක් ලෙස විකුණුම් ගිණුමට බැර කර ඇත.
   (iii) ආපසු එවුම් රු. 3 000 ක් විකුණුම් ගිණුමට හර කර ඇත.

   මෙම වැරදි නිසා ආයතනයේ ලාභය අවතක්සේරු වී ඇත්තේ,
   (1) රු. 18 500 කින් ය. (2) රු. 22 500 කින් ය. (3) රු. 25 200 කින් ය.
   (4) රු. 25 500 කින් ය. (5) රු. 28 200 කින් ය. (.....)

12. තොග අයිතම තුනක් සඳහා 2012.03.31 දිනට පහත සඳහන් තොරතුරු සමාගමක් විසින් සපයා ඇත.

අයිතම	නිෂ්පාදන පිරිවැය (රු.)	අපේක්ෂිත විකුණුම් ආදායම (රු.)	අපේක්ෂිත විකුණුම් වියදම (රු.)
A	13 000	15 000	5 000
B	10 000	16 000	4 000
C	17 000	19 000	7 000

   අයිතම ක්‍රමය අනුව 2012.03.31 දිනට තොගයේ වටිනාකම කුමක් ද?
   (1) රු. 32 000 (2) රු. 34 000 (3) රු. 40 000
   (4) රු. 42 000 (5) රු. 50 000 (.....)

● **ප්‍රශ්න අංක 13 සහ 14 ට පිළිතුරු සැපයීම සඳහා ව්‍යාපාර ආයතනයකට අදළ පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

(i) වැටුප්:

	රු.
2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ගෙවන ලද	44 000
ගෙවිය යුතු - 2011.03.31 දිනට	4 000
- 2012.03.31 දිනට	24 000

(ii) කුලී ආදායම්:
2011.10.01 දින කුලියට දුන් ගොඩනැගිල්ලක් සඳහා 2012.06.30 දිනෙන් අවසන් මාස 9 සඳහා රු. 90 000 ක කුලියක් ලැබුණි.

13. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ යුතු වැටුප් සහ කුලී ආදායම කොපමණ ද?

	වැටුප් (රු.)	කුලී ආදායම (රු.)
(1)	24 000	30 000
(2)	28 000	30 000
(3)	44 000	60 000
(4)	64 000	60 000
(5)	64 000	90 000

(.....)

14. 2012.03.31 දිනට ශේෂ පත්‍රයෙහි ඉහත ගනුදෙනුවලට අදළව හඳුනාගත යුතු මුළු වගකීම් කොපමණ ද?
   (1) රු. 20 000 (2) රු. 24 000 (3) රු. 30 000
   (4) රු. 54 000 (5) රු. 60 000 (.....)

● **ප්‍රශ්න අංක 15 සහ 16 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

2011.04.01 දින අමිල සහ කපිල හවුල් ව්‍යාපාරයකට එළඹුන අතර පහත සඳහන් එකඟතා ඇතිකර ගත්හ.

(අ) එක් හවුල්කරුවකුට රු. 100 000 ක වාර්ෂික වේතනයක් හිමිවීම
(ආ) 10% ක වාර්ෂික පොලියක් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂය මත හිමිවීම
(ඉ) පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභඅලාභ බෙදා ගැනීම

ප්‍රාග්ධනය ලෙස අමිල සහ කපිල විසින් පිළිවෙළින් මුදලින් රු. 400 000 ක් සහ රු. 200 000 ක් බැගින් යොදවන ලදී. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී හවුල් ව්‍යාපාරය රු. 360 000 ක ශුද්ධ ලාභයක් ඉපැයීය.

15. 2012.03.31 දිනට අමිල සහ කපිලගේ ජංගම ගිණුම් ශේෂයන් කොපමණ ද?

	අමිල (රු.)	**කපිල (රු.)**
(1)	140 000	120 000
(2)	160 000	140 000
(3)	200 000	160 000
(4)	216 000	144 000
(5)	600 000	360 000

(.....)

16. අමිල සහ කපිල රු. 50 000 බැගින් වර්ෂය තුළ දී ගැනිලි ලෙස ද ලබා ගත්තේ නම්, 2012.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකම කොපමණ වේ ද?

(1) රු. 260 000 (2) රු. 500 000 (3) රු. 600 000
(4) රු. 660 000 (5) රු. 860 000

(.....)

17. ලාභඅලාභ 2:2:1 අනුපාතයට බෙදගනිමින් අමල්, බිමල් සහ වමල් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2012.03.31 දින වමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර අමල් සහ බිමල් ලාභඅලාභ 3:2 අනුපාතයට බෙද ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමට එකඟ වූහ. මෙදිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපන ලදී. 2012.03.31 දිනට අමල් සහ බිමල්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්ට මෙම කීර්තිනාම ගැලපීම කරනු ලබන ශුද්ධ බලපෑම කුමක් ද?

	අමල්	**බිමල්**
(1)	බලපෑමක් නොමැත.	බලපෑමක් නොමැත.
(2)	රු. 80 000 කින් අඩු වේ.	බලපෑමක් නොමැත.
(3)	බලපෑමක් නොමැත.	රු. 80 000 කින් අඩු වේ.
(4)	රු. 160 000 කින් වැඩි වේ.	රු. 160 000 කින් වැඩි වේ.
(5)	රු. 240 000 කින් අඩු වේ.	රු. 160 000 කින් අඩු වේ.

(.....)

18. 2011.04.01 දිනට සීමිත අමර පොදු සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් 500 000 ක් ද, ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 10 000 000 ක් ද විය. 2011.07.01 දින තිබූ සෑම කොටස් 5 කට 1 බැගින් එක් කොටසක් රු. 20 ක මිලට කොටස් නිකුත් කරමින් සමාගම රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරන ලදී. තවද 2012.01.01 දින, එදිනට පැවති සෑම කොටස් 6 කට 1 බැගින් කොටසක මිල රු. 15 ක් වූ හිමිකම් නිකුතුවක් සිදුකරන ලදී. කොටස්කරුවන් විසින් සියලු ම හිමිකම් ලබාගන්නා ලදී. මෙම ගනුදෙනු නිසා 2012.03.31 දිනට සමාගමේ හිමිකමෙහි වැඩිවීම හෝ අඩුවීම කොපමණ ද?

(1) රු. 2 000 000 කින් අඩු වේ. (2) රු. 500 000 කින් අඩු වේ.
(3) රු. 1 500 000 කින් වැඩි වේ. (4) රු. 2 000 000 කින් වැඩි වේ.
(5) රු. 3 500 000 කින් වැඩි වේ.

(.....)

19. පහත සඳහන් කුමන අනුපාත අනුපිළිවෙළින් ආයතනයක **මූල්‍ය ස්ථාවරත්වය** සහ **ද්‍රවශීලතාව** මනිනු ලබයි ද?

(1) ණය - හිමිකම් අනුපාතය සහ ජංගම අනුපාතය
(2) ක්ෂණික අනුපාතය සහ ණයගැති පිරිවැටුම් අනුපාතය
(3) පොලී ආවරණ අනුපාතය සහ මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය
(4) මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය සහ ජංගම අනුපාතය
(5) ණය අනුපාතය සහ මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

(.....)

20. ණයගැතියකු විසින් ශේෂය පියවූ විට සමාගමක ජංගම අනුපාතයට සහ ක්ෂණික අනුපාතයට ඇතිවන බලපෑම කුමක් ද?

	ජංගම අනුපාතය	**ක්ෂණික අනුපාතය**
(1)	අඩු වේ.	අඩු වේ.
(2)	වැඩි වේ.	වැඩි වේ.
(3)	වැඩි වේ.	අඩු වේ.
(4)	අඩු වේ.	වැඩි වේ.
(5)	වෙනසක් නොවේ.	වෙනසක් නොවේ.

(.....)

21. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක් සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

	රු.
ණයට විකුණුම්	780 000
ණයගැතියන්ට දුන් වට්ටම්	65 000
බොල් ණය කපා හැරීම්	20 000
ආපසු එවුම්	35 000
වර්ෂය තුළ දී ණයගැති ශේෂය අඩුවීම	80 000

2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැතියන්ගෙන් ලද මුදල කොපමණ ද?

(1) රු. 580 000 (2) රු. 660 000 (3) රු. 695 000
(4) රු. 715 000 (5) රු. 740 000

(.....)

22. පහත සඳහන් කුමන ද ආයතනයක අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කෙරේ ද?

A - මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක්
B - ආයතනයට එරෙහි නොවිසඳුනු නඩුවක්
C - වෙනත් ආයතනයක් ලබාගත් ණයක් සඳහා ඇපකරුවකු වීමට ඇතිකරගත් එකඟතාවක්
D - බැංකු ගිණුමෙහි දක්වෙන අයිරා ශේෂයක්

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) A, B සහ D පමණි. (5) A, B සහ C පමණි.

(.....)

23. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මධුර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.06.30 දින අනුමත කරන ලදී. 2012.04.01 සහ 2012.06.30 අතර කාලය තුළ දී මෙම සමාගමේ පහත සඳහන් සිද්ධීන් සිදුවිය.

A - අඛණ්ඩව අලාභ ලබන ව්‍යාපාර අංශයක මෙහෙයුම් කටයුතු නතර කිරීමට සැලැස්මක් නිවේදනය කිරීම
B - ශේෂ පත්‍ර දිනට සැලකිය යුතු මුදලක් ගෙවිය යුතු ණයගැතියකු බුත්වත් වීම
C - වෙළඳපොළ අගයන් පහත වැටීම නිසා කෙටිකාලීන ආයෝජනවල අගය අඩුවීම
D - උසාවි තීන්දුවකට අනුව ශේෂ පත්‍ර දිනට හඳුනාගත යුතු වගකීමක් තිබූ බව තහවුරු වීම

ඉහත සඳහන් කුමන සිදුවීම් ශේෂ පත්‍ර දිනට ගැළපිය යුතු වේ ද?

(1) A සහ C පමණි. (2) B සහ D පමණි. (3) A, B සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ල ම.

(.....)

24. ගොඩනැගිල්ලක අපේක්ෂිත ඵලදායී ජීවකාලය සංශෝධනය කළ විට, මේ මහින් වන්කමෙහි වාර්ෂික ක්ෂයවීම්වල ඇතිවන වෙනස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනුයේ කෙසේ ද?

(1) ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකා වර්තමාන සහ අනාගත කාලච්ඡේදවල ලාභයට හෝ අලාභයට ගළපයි.
(2) ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.
(3) වරදක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.
(4) වරදක් ලෙස සලකා වර්තමාන කාලච්ඡේදයෙහි ලාභයට හෝ අලාභයට හෝ ගළපයි.
(5) ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.

(.....)

25. 2010.03.31 දින සමාගමක් රු. 1 300 000 ක පිරිවැයකට ඉඩමක් මිල දී ගත්තේ ය. 2011.03.31 දින මෙම ඉඩම එහි සාධාරණ අගය වූ රු. 1 100 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2012.03.31 දින එය නැවත එහි සාධාරණ අගය වූ රු. 1 600 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ප්‍රත්‍යාගණනයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන්නේ කෙසේ ද?

	2011.03.31 දිනට	**2012.03.31 දිනට**
(1)	රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී.	රු. 200 000 ක ලාභයක් හඳුනාගත් අතර ඉතිරි රු. 300 000 ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස සලකනු ලබයි.
(2)	රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී.	රු. 500 000 ක ප්‍රත්‍යාගණන සංචිතයක් හඳුනා ගනී.
(3)	රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී.	රු. 200 000 ක ලාභයක් හඳුනා ගනී.
(4)	රු. 200 000 ක අලාභයක් ප්‍රත්‍යාගණන සංචිතයට කපා හරියි.	රු. 500 000 ක ප්‍රත්‍යාගණන සංචිතයක් හඳුනා ගනී.
(5)	රු. 200 000 ක අලාභයක් ප්‍රත්‍යාගණන සංචිතයට කපා හරියි.	රු.200 000 ක ලාභයක් හඳුනා ගන්නා අතර ඉතිරි රු. 300 000 ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස සලකනු ලබයි.

(.....)

26. භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය සමාන වනුයේ,

(1) සෘජු පිරිවැය සහ පොදු කාර්ය පිරිවැයෙහි එකතුවට ය.
(2) අමුද්‍රව්‍ය පිරිවැය සහ ශ්‍රම පිරිවැයෙහි එකතුවට ය.
(3) ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙහි එකතුවට ය.
(4) ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පිරිවැයෙහි එකතුවට ය.
(5) නිෂ්පාදන පිරිවැය සහ නිෂ්පාදන නොවන පිරිවැයෙහි එකතුවට ය. (.....)

27. X නමැති අමුද්‍රව්‍යයෙහි කාර්තුවක ඉල්ලුම ඒකක 1 250 කි. එම ද්‍රව්‍යයෙහි ඒකකයක ගැනුම් මිල රු. 250 කි. තොග ඇණවුම් පිරිවැය ඇණවුමකට රු. 25 ක් වන අතර තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක ගැනුම් මිලෙන් 10% ක් වේ. මෙම අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය,

(1) ඒකක 50 කි. (2) ඒකක 100 කි. (3) ඒකක 1 000 කි.
(4) ඒකක 2 500 කි. (5) ඒකක 5 000 කි. (.....)

28. සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිපදවා විකුණනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රු. 75 ක් වන අතර ඒකකයක විචල්‍ය පිරිවැය රු. 50 කි. ස්ථාවර පිරිවැය රු. 50 000 කි. සමච්ඡේද ලක්ෂ්‍ය (ඒකක) සහ විකුණුම් මට්ටම ඒකක 5 000 දී ආරක්ෂිත ආන්තිකය (රු.) පිළිවෙළින්,

(1) ඒකක 2 000 ක් සහ රු. 50 000 ක් වේ. (2) ඒකක 2 000 ක් සහ රු. 225 000 ක් වේ.
(3) ඒකක 3 000 ක් සහ රු. 75 000 ක් වේ. (4) ඒකක 3 000 ක් සහ රු. 225 000 ක් වේ.
(5) ඒකක 5 000 ක් සහ රු. 375 000 ක් වේ. (.....)

29. නිෂ්පාදන ව්‍යාපාරයක සමච්ඡේද ලක්ෂ්‍යට අදළව පහත සඳහන් කුමන ප්‍රකාශන නිවැරදි වේ ද?

A - ලාභයක් හෝ අලාභයක් හෝ නොමැති වීම.
B - මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වීම.
C - විකුණුම් ආදායම මුළු පිරිවැයට සමාන වීම.
D - විකුණුම් ආදායම මුළු විචල්‍ය පිරිවැයට සමාන වීම.
E - මුළු ස්ථාවර පිරිවැය මුළු විචල්‍ය පිරිවැයට සමාන වීම.

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, B, C සහ D පමණි.
(4) A, C, D සහ E පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම. (.....)

30. සමාගමක නව ව්‍යාපෘතියක මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේ දී පහත සඳහන් කුමන අයිතම අඩංගු කෙරේ ද?

A - ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර අත්පත් කර ගැනීමේ පිරිවැය
B - එම යන්ත්‍ර ක්ෂය
C - මෙම යන්ත්‍රවල අපේක්ෂිත සුන්බුන් අගය
D - නව ව්‍යාපෘතිය නිසා දරීමට සිදුවන මෙහෙයුම් වියදම්
E - ව්‍යාපෘතිය සම්බන්ධව වෙළඳපොළ සමීක්ෂණයක් කිරීම සඳහා දරන ලද පිරිවැය

(1) A, B සහ D පමණි. (2) A, C සහ D පමණි. (3) A, C සහ E පමණි.
(4) A, D සහ E පමණි. (5) A, B, C, D සහ E යන සියල්ලම. (.....)

2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	5	16.	5
02.	3	17.	2
03.	5	18.	3
04.	2	19.	1
05.	4	20.	5
06.	3	21.	5
07.	2	22.	3
08.	3	23.	2
09.	4	24.	1
10.	4	25.	1
11.	2	26.	3
12.	1	27.	2
13.	4	28.	2
14.	4	29.	1
15.	3	30.	2

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **04** බැගින් මුළු ලකුණු **120**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත සඳහන් අංගයන්ට අදළව මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස දක්වන්න.

අංගය	මූල්‍ය ගිණුම්කරණය	කළමනාකරණ ගිණුම්කරණය
(1) තොරතුරු භාවිත කරන්නන්	.....	.....
	.....	.....
(2) තොරතුරු වාර්තා කිරීමේ වාර ගණන	.....	.....
	.....	.....

පිළිතුරු

	මූල්‍ය ගිණුම්කරණය	කළමණාකරණ ගිණුම්කරණය
1.	අභ්‍යන්තර හා බාහිර	අභ්‍යන්තර පාර්ශවය (02)
2.	සාමාන්‍යයෙන් වාර්ෂිකව	අවශ්‍යතාවය මත වාර ගණන වෙනස් වේ (02)

32. වර්ෂය තුළ දී තනි ව්‍යාපාරයක, වත්කම් රු. 400 000 කින් ද වගකීම් රු. 50 000 කින් ද වැඩි විය. මෙම වර්ෂයේ දී ලාභය රු. 250 000 ක් නම්, අයිතිකරු විසින් හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය කොපමණ ද?

.....

පිළිතුර

රු 100, 000/= (04)

33. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රඥප්ති පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත මණ්ඩල **දෙකක්** සඳහන් කරන්න.

(1) ..... (2) .....

පිළිතුරු

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව
2. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය
3. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති කමිටුව

} ඕනෑම 2ක් සඳහා ලකුණු 02 බැගින් (04)

34. පහත දක්වෙන සිදුවීම්වල දී ආයතනයක් විසින් අනුගත වන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණ කවරේ ද?

සිදුවීම	ගුණාත්මක ගති ලක්ෂණය
(අ) සෑම වර්ෂයක දී ම සරල මාර්ග ක්‍රමය මත උපකරණ ක්ෂය කරනු ලැබීම.	.....
(ආ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අත්පත්කරගත් උපකරණයක් වත්කමක් ලෙස සටහන් කිරීම.	.....

පිළිතුරු

(අ) සංසන්දනීයතාවය / සංගතතාව (අනුරූපීතාව) (02)

(ආ) විශ්වාසනීය බව / යථානුරූපිබව (02)

35. පහත දක්වෙන එක් එක් අවස්ථාවට වඩාත් සම්බන්ධ **ගිණුම්කරණ සංකල්පය** දක්වන්න.

A - සමාගමක ආදයම් ප්‍රකාශනයෙහි ආදයම් හඳුනාගනු ලබන්නේ එය ඉපයූ විට ය.

B - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමාගමක ජීව කාලය මාස 12 ක් බැගින් වූ කාලපරිච්ඡේදවලට බෙදා වෙන් කෙරේ.

C - සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී උද්ධමනය සඳහා ගැළපුම් කරනු නොලැබේ.

D - වගකීම් සහතික සම්බන්ධයෙන් මතුවිය හැකි ගෙවීම් සඳහා ප්‍රතිපාදනයක් සමාගමක මූල්‍ය ප්‍රකාශනවල කරනු ලැබේ.

අයිතම	**ගිණුම්කරණ සංකල්පය**
A -	.....
B -	.....
C -	.....
D -	.....

පිළිතුරු

A - උපලබ්ධි (01)
B - කාලච්ඡේද (01)
C - ඓතිහාසික පිරිවැය (01)
D - ආරක්ෂණ (විචක්ෂණ) /ගැලපුම් (01)

36. ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් තොරව පවත්වාගෙන යන ආයතනයක 'ලැබීම් සහ ගෙවීම් ගිණුම' සහ 'ආදයම් සහ වියදම් ගිණුම', ඒවා පිළියෙල කිරීමේ අරමුණ සහ පදනම යන කරුණු මත වෙන්කොට දක්වන්න.

	ලැබීම් සහ ගෙවීම් ගිණුම	**ආදයම් සහ වියදම් ගිණුම**
අරමුණ	.....	.....
පදනම	.....	.....

පිළිතුරු

අරමුණු :	සමිතියේ අවසාන මුදල් හෝ බැංකු ශේෂය දැන ගැනීම/ මුදල් ලැබීම් සහ ගෙවීම් සටහන් කිරීම.	වියදමට වඩා ආදායමෙහි අතිරික්තය හෝ ඌනතාවය දැන ගැනීම/සංගමයේ මූල්‍ය ප්‍රතිඵලය දැන ගැනීම (02)
පදනම :	මුදල් පදනම	උපචිත පදනම (02)

● **ප්‍රශ්න අංක 37 සහ 38 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් විසින් 2012 මාර්තු මස දී දරන ලද රු. 60 000 ක් වූ කාර්යාල වියදම්, කාර්යාල උපකරණ ගිණුමට රු. 600 000 ක් ලෙස පිටපත් කර ඇත. කාර්යාල උපකරණ වාර්ෂිකව 10% ක අනුපාතයකට පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර මෙම මාසය සඳහා ද ක්ෂය කර ඇත.

37. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට මෙම වැරැද්ද නිසා ඇතිවන ශුද්ධ බලපෑම කොපමණ ද?

.....

පිළිතුරු

(02) (02)
රු 55,000කින් ලාභය වැඩිවේ

38. කාර්යාල උපකරණ සහ කාර්යාල වියදම් ලෙජර් ගිණුම් නිවැරදි කිරීමට ජර්නල් සටහන ලියන්න.

.....

.....

.....

පිළිතුරු

	රු.		රු.
කාර්යාල වියදම් ගිණුම	'හර' 60,000	අවිනිශ්චිත ගිණුම	'හර' 540,000
අවිනිශ්චිත ගිණුම	'හර' 540,000	**හෝ** කාර්යාල උපකරණ ගිණුම	540,000
කාර්යාල උපකරණ ගිණුම	600,000	කාර්යාල වියදම් ගිණුම	'හර' 60,000
		කාර්යාල උපකරණ ගිණුම	60,000

(04)

39. ගින්නක් නිසා 2012.03.31 දිනට පැවති අමල් ව්‍යාපාරයේ මුළු තොගය සම්පූර්ණයෙන් විනාශ විය. එදිනට පැවති තොරතුරු පහත දක්වේ.

2011.04.01 දිනට තොගය	රු. 200 000
වර්ෂය සඳහා ගැනුම්	රු. 1 500 000
වර්ෂයේ විකුණුම්	රු. 2 000 000

ව්‍යාපාරයේ විකුණුම් මත දළලාභ ආන්තිකය 20% කි.

(අ) ගින්නෙන් විනාශ වූ තොගයේ වටිනාකම කොපමණ ද?

.....

(ආ) රක්ෂණ සමාගමක් විසින් තොගයේ මුළු වටිනාකමෙන් 80% ක් හානිපූර්ණය කිරීමට එකඟ වී ඇත්නම්, 2012.03.31 දිනට සමාගමේ මුළු වත්කම්වලට ඇති වන ශුද්ධ බලපෑම කොපමණ ද?

.....

පිළිතුරු

(අ) රු 100,000 (02)

(ආ) රු 20,000 කින් අඩුවේ. (02)

- **ප්‍රශ්න අංක 40 සහ 41 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 2012 පෙබරවාරි මස සඳහා පහත සඳහන් තොරතුරු දී ඇත.

	රු.
අමුද්‍රව්‍ය ගැනුම්	300 000
සෘජු ශ්‍රමය	170 000
සෘජු වියදම්	30 000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	300 000

තොගය:	**2012.02.29 (රු.)**	**2012.01.31 (රු.)**
අමුද්‍රව්‍ය	50 000	100 000
නොනිමි ද්‍රව්‍ය	150 000	100 000
නිමි භාණ්ඩ	100 000	180 000

- නොනිමි ද්‍රව්‍ය තොගය නිෂ්පාදන පිරිවැයට ගළපන බව උපකල්පනය කරන්න.
- නිෂ්පාදිත අයිතම විකුණුම් පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් පවත්වා ගනිමින් විකුණනු ලැබේ.

40. 2012 පෙබරවාරි මාසය සඳහා ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(අ) ප්‍රාථමික පිරිවැය :..... (ආ) නිෂ්පාදන පිරිවැය :.....

පිළිතුරු

(අ) රු 550,000 (02)

(ආ) රු 800,000 (02)

41. මෙම මාසය තුළ දී උපයන ලද දළ ලාභය කොපමණ ද?

.....

පිළිතුර

රු 220,000/= (04)

- **ප්‍රශ්න අංක 42 සහ 43 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

2012.03.31 සහ 2011.03.31 දිනවලට සීමිත සුමුදු පොදු සමාගමේ යන්ත්‍රසූත්‍ර සම්බන්ධ ශේෂපත්‍ර උද්ධෘතයන් පහත දී ඇත.

	2012.03.31 (රු.'000)	**2011.03.31 (රු.'000)**
යන්ත්‍රසූත්‍ර - පිරිවැයට	1 500	1 000
සමුච්චිත ක්ෂය	500	400

අතිරේක තොරතුරු:

2012.03.31 දින සමාගම විසින් පිරිවැය රු. 300 000 ක් වූ යන්ත්‍රයක් රු. 160 000 කට විකුණන ලදී. මෙදිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම රු. 200 000 ක් විය. මෙදිනම නව යන්ත්‍රයක් මුදලට අත්පත් කරගන්නා ලදී.

42. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රසූත්‍රවලට අදළව ආයෝජන කටයුතුවලින් ඇති වූ මුදල් ප්‍රවාහ ගලාඒම් සහ ගලායෑම් දක්වන්න.

(අ) මුදල් ප්‍රවාහ ගලාඒම් .....

(ආ) මුදල් ප්‍රවාහ ගලායෑම් .....

පිළිතුරු

(අ) රු 160,000 යන්ත්‍ර විකිණීමෙන් (02)

(ආ) රු 800,000 යන්ත්‍ර මිලදී ගැනීම (02)

43. ඉහත ගනුදෙනුවලින් පැනනහින මුදල්-නොවන අයිතමයක් (වටිනාකම ද සහිතව) දක්වන්න.

.....

පිළිතුර

(02) (02)

යන්ත්‍ර විකුණුම් අලාභය රු 40,000 හෝ වාර්ෂික යන්ත්‍ර ක්ෂය රු 200,000

44. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමාගමක මෙහෙයුම් කටයුතු නිසා එහි වැඩබිම (ඉඩම) අපවිත්‍ර වූ අතර මේ ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මෙම ඉඩම පවිත්‍ර කළ යුතු යැ'යි නියෝග කරන ලදී. මේ සඳහා සමාගමට සැලකිය යුතු මුදලක් දැරීමට සිදු වේ. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් මේ සඳහා ප්‍රතිපාදනයක් කළ යුතු ද යන්න කරුණු සහිතව දක්වන්න.

.....

.....

.....

.....

පිළිතුරු

ප්‍රතිපාදනයක් කළ යුතුයි.

හේතු

1. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම.
2. අගය විශ්වාසදායි ලෙස මැනිය හැකිවීම.
3. සම්පත් පිටතට ගලායෑමේ භව්‍යතාවයක් තිබීම. (04)

හෝ
ප්‍රතිපාදනයක් නොකළ යුතුයි
හේතු :
1. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වුවද
2. සම්පත් පිටතට ගලායෑමේ භව්‍යතාවයක් තිබුනද
3. අගය විශ්වාසදායි ලෙස මැනිය නොහැකිවීම. (04)

45. සපත්තු නිෂ්පාදන ආයතනයකට අදළව පහත දක්වෙන එක් එක් පිරිවැය අයිතමය **සෘජු** හෝ **වක්‍ර** ලෙස වර්ගකරන්න.

(අ) පදම්කළ සම් පිරිවැය .....

(ආ) කම්හල් කළමනාකරුගේ වැටුප් .....

(ඉ) යන්ත්‍ර මෙහෙයුම්කරුවන්ගේ වේතන .....

(ඊ) යන්ත්‍ර ක්ෂය .....

පිළිතුරු

සෘජු (01)
වක්‍ර (01)
සෘජු (01)
වක්‍ර (01)

46. සමාගමක නිෂ්පාදන මට්ටම් දෙකක දී පිරිවැය දත්ත පහත දී ඇත.

පිරිවැය අයිතම	**ඒකක 10 000(රු.)**	**ඒකක 20 000 (රු.)**
සෘජු ශ්‍රමය	30 000	60 000
විදුලිය	10 000	15 000
කම්හල් කුලී	15 000	15 000

මෙම එක් එක් පිරිවැය අයිතම ස්ථාවර, විචල්‍ය හෝ අර්ධ විචල්‍ය හෝ ලෙස වර්ග කරන්න.

පිරිවැය අයිතමය **වර්ගීකරණය**

(අ) සෘජු ශ්‍රමය : .....

(ආ) විදුලිය : .....

(ඉ) කම්හල් කුලී : .....

පිළිතුරු

(අ) විචල්‍ය (01)
(ආ) අර්ධ විචල්‍ය (02)
(ඉ) ස්ථාවර (01)

- **ප්‍රශ්න අංක 47 සහ 48 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් තනි භාණ්ඩයක් මිල දී ගෙන විකුණනු ලබයි. විකුණුම් මිල ඒකකයක් සඳහා රු. 250 කි. 2012.07.01 දින ආරම්භක තොගයේ ඒකකයක් රු. 150 බැගින් වූ ඒකක 100 ක් විය. 2012.07.10 දින සමාගම ඒකකයක් රු. 200 බැගින් ඒකක 150 ක් මිල දී ගන්නා ලදී. 2012.07.31 දින සමාගම විසින් ඒකක 200 ක් විකුණන ලදී.

47. තොග නිකුත් කිරීමේ දී පෙර - ඇතුළු - පෙර - පිට (FIFO) මිල කිරීමේ ක්‍රමය භාවිත කරන්නේ නම්, පහත දෑ දක්වන්න.

(අ) 2012 ජූලි මාසය සඳහා විකුණුම් පිරිවැය: .....

(ආ) 2012.07.31 දිනට තොගයේ වටිනාකම: .....

පිළිතුරු

(අ) රු 35,000 (02)
(ආ) රු 10,000 (02)

48. තොග නිකුත් කිරීමේ දී බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිත කරන්නේ නම් 2012 ජූලි මාසය සඳහා දළ ලාභය කොපමණ ද?

.....

පිළිතුර

රු 14,000 (04)

49. සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලබන තනි භාණ්ඩයක් සම්බන්ධව අයවැයගත ආදයම් සහ පිරිවැය දත්ත පහත දී ඇත. විකුණුම් පරිමාව ඒකක 20 000; ඒකකයක විකුණුම් මිල - රු. 20; දායක විකුණුම් අනුපාතය - 40%; ස්ථාවර පිරිවැය - රු. 100 000.

ගණනය කරන්න:

(අ) සමච්ඡේද ලක්ෂ්‍ය (ඒකක) .....

(ආ) අයවැයගත විකුණුම් පරිමාවේ දී ලාභය .....

පිළිතුරු

(අ) ඒකක 12,500 (02)

(ආ) රු 60,000 (02)

50. අනිකුත් සාධක නොවෙනස්ව පවතියයි උපකල්පනය කර පහත සඳහන් එක් එක් අයිතමය ආයෝජන ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩි** කරයි ද **අඩු** කරයි ද යන්න දක්වන්න.

(අ) අපේක්ෂිත මුදල් ප්‍රවාහ ගලාඒමේ වැඩි වීමක් .....

(ආ) වට්ටම් අනුපාතයේ වැඩිවීමක් .....

(ඉ) ආරම්භක ආයෝජනයේ අඩුවීමක් .....

(ඊ) වත්කම්වල සුන්බුන් අගයේ අඩුවීමක් .....

පිළිතුරු

වැඩි කරයි. (01)


අඩු කරයි. (01)

වැඩි කරයි. (01)

අඩු කරයි. (01)

2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:

I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ



1, 2, 4, 9, 22, 26, 32, 45 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණු අතර මේ සඳහා විෂය දැනුම බෙහෙවින්ම බලපා ඇත. සපයා ඇති මූලාශ්‍ර, සිද්ධි හා ගැලපීමේ හැකියාව අයදුම්කරුවන් සතුව ඇති බව අනාවරණය වේ.

ඉහත ප්‍රස්තාරය අනුව සිසුන් අඩු සාධන මට්ටමක් පෙන්වන ප්‍රශ්න වනුයේ 33, 44 යන ප්‍රශ්න වේ. 44 සහ 33 ප්‍රශ්නයන්හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රමිති සැකසීමේ නීතිමය රාමුව පිළිබඳ ව සිසුන්ගේ අවබෝධය මද බව පෙන්නුම් කෙරේ.

තවද 7, 11, 18, 19, 20, 21, 25, 27, 30, 33, 34, 37, 41, 42, 44, 48, 49 යන ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 50%කට අඩු ප්‍රතිශතයකි. එම ප්‍රශ්න අතුරින් කිහිපයක් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ. මෙම විග්‍රහයන් සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේ එකම සංකල්පය හෝ මූලධර්ම වටා ගොඩනැගි ඇති ප්‍රශ්න තෝරා ගෙන ඇති බව පෙනේ.

7 හා 34 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර අනුව සාධන මට්ටම පිළිවෙළින් 38%ක් හා 39%ක් වැනි අඩු අගයක් පවතින බව දක්නට ලැබේ. ඒ අනුව පෙනී යන්නේ ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ ප්‍රායෝගිකව භාවිතා කිරීමට නොහැකි වී ඇති බවයි. ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන ඇසුරෙන් සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතුය.

11 හා 37 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර අනුව සාධන මට්ටම පිළිවෙළින් 46%ක් හා 27%ක් වේ. එහිදී ලාභයට බලපාන ආදායම් හා වියදම් ගණුදෙනු පැහැදිලි ව හඳුනා ගැනීමට සිසුන්ට අපහසු වී තිබුණි. ලාභය නිවැරදි ව ගණනය කිරීමේදී, ආදායම් වැඩිවීම හා වියදම් අඩුවීම තුළ ලාභය වැඩිවන බවද, ආදායම් අඩුවීම හා වියදම් වැඩිවීම තුළ ලාභය අඩුවන බව ද තහවුරු වන බවට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානය යොමු කළ යුතුය.

ඉහත විශ්ලේෂණ අනුව විෂය නිර්දේශයට අදාළ ව නිකුත් කර ඇති පොත්පත් හා අතිරේක ඉගෙනුම් උපකරණ සහ එකිනෙක සිද්ධි හා කරුණු නිවැරදි ව ගලපා ගැනීමට පන්ති කාමර ක්‍රියාකාරකම් යොදා ගැනීම සුදුසු වේ.

2.1.6 I වන ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ප්‍රතිශතය					
		1	2	3	4	5	කිසිදු පිළිතුරක් සපයා නොමැත
1	5	1%	6%	2%	2%	**89%**	-
2	3	4%	7%	**82%**	5%	2%	-
3	5	10%	24%	2%	13%	**51%**	-
4	2	10%	**79%**	5%	15%	1%	-
5	4	8%	11%	16%	**54%**	10%	1
6	3	7%	8%	**59%**	8%	17%	1
7	2	14%	**38%**	9%	37%	1%	1
8	3	3%	2%	**67%**	8%	20%	-
9	4	4%	3%	3%	**82%**	8%	-
10	4	1%	23%	3%	**70%**	2%	1
11	2	4%	**45%**	18%	17%	15%	1
12	1	**53%**	21%	16%	5%	4%	1
13	4	5%	3%	11%	**73%**	8%	-
14	4	3%	31%	5%	**58%**	2%	1
15	3	10%	4%	**63%**	20%	3%	0
16	5	19%	18%	6%	5%	**51%**	1
17	2	6%	**64%**	5%	11%	14%	-
18	3	7%	9%	**39%**	17%	26%	2
19	1	**48%**	6%	9%	28%	8%	1
20	5	28%	10%	9%	14%	**38%**	1
21	5	42%	8%	3%	3%	**43%**	1
22	3	2%	7%	**76%**	10%	5%	-
23	2	2%	**57%**	14%	20%	7%	-
24	1	**70%**	13%	2%	5%	10%	-
25	1	**34%**	14%	3%	23%	25%	1
26	3	7%	3%	**83%**	4%	3%	-
27	2	27%	**45%**	8%	13%	6%	1
28	2	7%	**67%**	9%	10%	6%	1
29	1	**62%**	10%	9%	10%	8%	1
30	2	10%	**45%**	6%	24%	14%	1

වගුව 01

ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා ප්‍රශ්නවල එක් එක් වරණය සඳහා අයදුම්කරුවන් ප්‍රතිචාර දක්වා ඇති ආකාරය ඉහත වගුව 01 හි දැක්වේ. එම වගුව අනුව සමහර ප්‍රශ්න නිවැරදි වරණය මෙන්ම වැරදි වරණ ද අයදුම්කරුවන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් තෝරාගෙන ඇති බව පෙනී යයි. එවැනි ප්‍රශ්න කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ප්‍රශ්න අංක 3 සඳහා නිවැරදි පිළිතුර වූ 5 වරණය තෝරාගත් ප්‍රතිශතය 51%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 24%ක්ම 2 වරණය නිවැරදි වරණය වශයෙන් තෝරා ගෙන ඇත. ගණුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලියවිලි පිළිබඳ අවබෝධය අයදුම්කරුවන් තුළ අඩු මට්ටමක පවතින බව අනාවරණය වේ. මූලාශ්‍ර ලේඛන භාවිතය පිළිබඳ ව අවබෝධය තහවුරු වන ලෙස පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු බව මෙහිදී අවධාරණය කළ යුතුය.

14 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූ 4 වරණය තෝරාගත් ප්‍රතිශතය 58%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 31%ක්ම 2 වරණය නිවැරදි වරණය වශයෙන් තෝරාගෙන ඇත. මෙයට හේතු වනුයේ,
(අ) උපචිත වැටුප් පමණක් වගකීම ලෙස හඳුනාගෙන තිබීම සහ
(ආ) කලින් ලද කුළී ආදායම වගකීමක් ලෙස හඳුනාගෙන නොතිබීම ය.
ජංගම වගකීම් සඳහා, උපචිත වියදම් පමණක් නොව කලින් ලැබූ ආදායම්ද ඇතුළත් වන බව තහවුරු වනසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

18 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 26%ක් නිවැරදි පිළිතුර වශයෙන් 5 වරණය වරදවා වටහා ගෙන ඇත. නිවැරදි පිළිතුර වන 3 වරණය තෝරා ගැනීම 39% දක්වා අඩුවීමට හේතුව වන්නේ ප්‍රසාද කොටස් නිකුතුවකින් හිමිකමට බලපෑමක් නොවන බව සිසුන්ට අවබෝධයක් නොතිබීමය. ප්‍රසාද කොටස් නිකුතුවකට හෝ හිමිකම් නිකුතුවකට පසුව සමාගමේ හිමිකමට සිදුවන බලපෑම පිළිබඳ ව අභ්‍යාස පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිදුකළ යුතුය.

19 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 48%ක් නිවැරදි පිළිතුර වන 1 වරණය තෝරා ගෙන ඇත. 4 වරණය නිවැරදි යැයි තෝරා ඇති ප්‍රතිශතය 28%කි. මෙයට හේතුව වනුයේ මූල්‍ය ස්ථාවරත්වයට අදාළ වන අනුපාත පිළිබඳ අවබෝධය අඩු මට්ටමක පැවතීමයි. ගිණුම්කරණ අනුපාත ඉගැන්වීමේදී අනුපාත පමණක් නොව අනුපාත කුමන අරමුණු සඳහා ගණනය කෙරේ ද යන්න පිළිබඳව ද අවබෝධයක් ලබාදිය යුතුය.

20 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූ 5 වරණය තෝරාගත් ප්‍රතිශතය 38%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 28%ක්ම 1 වරණය නිවැරදි වරණය වශයෙන් තෝරා ගෙන ඇත. එසේ නිවැරදි පිළිතුර තෝරාගත් ප්‍රතිශතය අඩුවී ඇත්තේ ගනුදෙනුවක් නිසා අනුපාතයකට ඇතිවන බලපෑම ගැන අවබෝධය අඩුවීම නිසාය. එබැවින් එවැනි ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදුකළ යුතුය.

ප්‍රශ්න අංක 21 සඳහා නිවැරදි පිළිතුර වූ 5 වරණය තෝරාගත් ප්‍රතිශතය 43%ක් වන අතර ඊට ආසන්න සංඛ්‍යාවක් එනම් 42%ක්ම වැරදි පිළිතුරක් වූ 1 වරණය නිවැරදි වරණය වශයෙන් තෝරාගෙන ඇත. එයට හේතුව ලෙස වර්ෂය තුළ දී ණයගැති ශේෂය වෙනස්වීම තුළින් මුදල් ප්‍රවාහයට වන බලපෑම අවබෝධ කර නොගැනීම ලෙස දැක්විය හැක. වර්ෂය තුළ දී ණයගැති ශේෂය අඩුවීම මුදල් ප්‍රභවයක් ලෙසත්, ණයගැති ශේෂය වැඩිවීම මුදල් යෙදවීමක් ලෙසත් හඳුනා ගැනීමට හැකිවන ලෙස සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතුයි.

23 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 57%ක් නිවැරදි පිළිතුර වූ 2 වරණය තෝරා ගෙන ඇත. වැරදි පිළිතුර වූ 3 වරණය සඳහා 14%ක්ද, 4 වරණය 20%ක්ද තෝරාගෙන ඇත. මෙයට හේතුව වනුයේ වාර්තා කළ කාලච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ අවබෝධයක් නොපැවතීමයි. වාර්තා කළ කාලච්ඡේදයට පසු සිදුවීම්වල අදාළ ප්‍රමිතය ඇසුරෙන් ගළපන සිද්ධි හා නොගළපන සිද්ධි පිළිබඳ අවබෝධය තහවුරු වන ලෙස ඉගැන්වීම් කටයුතු සංවිධානය කළ යුතුය.

25 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 23%ක් වැරදි පිළිතුරක් වූ 4 වරණය තෝරා ගෙන ඇත. එමෙන්ම 25%ක් වැරදි පිළිතුරක් වූ 5 වරණය තෝරාගෙන ඇත. නිවැරදි වරණය 1 තෝරා ගැනීම 34% දක්වා අඩුවීමට හේතුව ලෙස දැක්විය හැක්කේ ප්‍රත්‍යාගණන අතිරික්තය සහ ඌණතාවයන් නිවැරදි ව ගිණුම්ගත කිරීම පිළිබඳ ව අවබෝධය නොමැතිවීමයි. LKAS 16ට අනුව ප්‍රත්‍යාගණන අතිරික්තය සහ ඌණතාවන් ගිණුම්ගත කිරීම පිළිබඳ ව ඇති නිර්දේශ පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතුය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 1	ලකුණු 2	ලකුණු 3	ලකුණු 4	කිසිදු පිළිතුරක් සපයා නොමැත
31	19%	-	26%	-	47%	8%
32	19%	-	-	-	75%	6%
33	55%	-	22%	-	7%	16%
34	34%	-	34%	-	22%	10%
35	8%	16%	27%	34%	13%	2%
36	27%	-	26%	-	37%	10%
37	56%	-	14%	-	19%	11%
38	36%	-	-	-	49%	15%
39	27%	-	23%	-	40%	10%
40	27%	-	22%	-	45%	6%
41	53%	-	-	-	33%	14%
42	23%	-	40%	-	28%	9%
43	26%	-	18%	-	45%	11%
44	58%	-	-	-	14%	28%
45	1%	3%	16%	24%	55%	1%
46	6%	20%	9%	3%	60%	2%
47	34%	-	10%	-	48%	5%
48	57%	-	-	-	26%	17%
49	38%	-	18%	-	31%	13%
50	3%	11%	39%	24%	20%	3%

වගුව 02

ඉහත වගුව 02 හි සඳහන් ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය අනුව සමහර ප්‍රශ්න සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් ප්‍රතිශතය 50% ඉක්මවා ඇති බව පෙනී යයි. එවැනි ප්‍රශ්න කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

33 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 55%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. උපරිම ලකුණු වන ලකුණු 4 ලබාගෙන ඇත්තේ 7%ක් පමණි. මෙයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතට අනුව ගිණුම්කරණ ප්‍රමිත සකස් කිරීම සහ අධීක්ෂණයට ඇති ආයතන පිළිබඳ අවබෝධය අඩු මට්ටමක පැවතීමයි. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතුය.

44 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 58%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර උපරිම ලකුණු වන 4 ලබාගෙන ඇත්තේ 14%කි. LKAS 37හි සඳහන් ප්‍රතිපාදන කිරීම සම්බන්ධව කොන්දේසි පිළිබඳ, සිසුන් තුළ නිවැරදි අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි. එබැවින් LKAS 37 පිළිබඳ ව සිසුන්ට පැහැදිලි ව අවබෝධයක් ලබාදිය යුතුය.

48 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 57%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර උපරිම ලකුණු වන 4 ලබාගෙන ඇත්තේ 26%කි. මෙයට හේතුව වන්නේ තොග නිකුත් කිරීමේ මිල ක්‍රමයක් වන බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය යටතේ නිකුත් කිරීමේ පිරිවැය ගණනය කිරීමට අපහසු වීමයි. LKAS 2- තොග සඳහා වන ප්‍රමිතියට අනුව නිර්දේශිත මිල ක්‍රම වන F.I.F.O හා බර තැබූ සමාන්‍ය ක්‍රම යටතේ පහත දැ පිළිබඳ අවබෝධයක් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ලබා දිය යුතුය.

1. තොග නිකුතු මිල කිරීම
2. තොග ආගණනය
3. දළ ලාභය ගණනය කිරීම

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් යුක්තය. පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි. සෙසු ප්‍රශ්න 5න් 4ක් තෝරා ගත යුතු අතර එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය 100
II පත්‍රය 100
අවසාන ලකුණු 200 ÷ 2 = 100

* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකම ලකුණු දෙගුණ කර ලබා දෙනු ඇත.
ඒ අනුව අවසාන ලකුණු ගණනය කිරීම :
I පත්‍රය 200
II පත්‍රය 200
අවසාන ලකුණු 400 ÷ 4 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3 සහ 4, ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

01 ප්‍රශ්නය

1. 2012.03.31 දිනට සීමිත පර්ල් පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

	හර (රු.'000)	බැර (රු.'000)
ඉඩම් (පිරිවැයට)	2 200	
ලී බඩු සහ සවිකිරීම් (පිරිවැයට)	4 000	
2011.04.01 දිනට සමුච්චිත ක්ෂය - ලී බඩු සහ සවිකිරීම්		400
වෙළඳ ණයගැතියෝ	400	
2011.04.01 දිනට අඩමාන ණය සඳහා වෙන්කිරීම්		50
2011.04.01 දිනට තොගය (පිරිවැය මත)	500	
මුදල් සහ මුදල් සමාන ද	150	
විකුණුම්		4 800
ගැනුම්	1 500	
වියදම්	1 000	
වෙළඳ ණයහිමියෝ		300
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 400 000)		3 000
2011.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		1 200
	9 750	**9 750**

අතිරේක තොරතුරු:

(අ) ශේෂ පිරික්සුමේ දී ඇති වියදම් පහත අයිතමවලින් සමන්විත වේ:

වියදම් වර්ගය	**රු. '000**
බෙදහැරීම්	450
පරිපාලන	500
මූල්‍ය	50
එකතුව	**1 000**

(ආ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්වීම පහත පරිදි වේ.

	රු. '000
2011.04.01 දිනට ශේෂය	2 000
වර්ෂය තුළ දී නිකුත් කළ කොටස් 100 000 හි අගය	1 000
2012.03.31 දිනට ශේෂය	3 000

(ඉ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැළපීම් කළ යුතු වේ.

(i) 2012.03.31 දින වෘත්තීය තක්සේරුකරුවකු විසින් ඉඩම් රු. 2 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ii) ලී බඩු සහ සවිකිරීම් පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iii) වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත වාර්ෂිකව 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(iv) 2012.03.31 දිනට තොගයේ පිරිවැය රු. 450 000 ක් විය. එදිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

(v) සමාගම විසින් මාස හයක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය මත රු. 60 000 ක ප්‍රතිපාදනයක් සමාගම විසින් කළ යුතු යැයි විශ්වසනීය ලෙස තක්සේරු කර ඇත.

(vi) භාණ්ඩ බෙදහැරීම සඳහා 2011.04.01 දින මූල්‍ය කල්බදු ක්‍රමය මත සමාගම විසින් මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදී. එදිනට මෝටර් රථයේ සාධාරණ අගය රු. 2 500 000 ක් වූ අතර එය අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට සමාන වේ. පහත සඳහන් තොරතුරු ද දී ඇත.

කල්බදු කාලය - වසර 5 යි.
මෝටර් රථයේ ඵලදායී ජීව කාලය - වසර 5 යි.
වාර්ෂික කල්බදු වාරිකය (වසර අවසානයේ ගෙවිය යුතු) - රු. 600 000 (මෙයින් රු. 100 000 ක් පොලිය වේ.)

2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී කල්බදු ණයහිමියන් සඳහා ගෙවූ වාරිකය වෙළඳ ණයහිමි ගිණුමට හර කර ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් කර නොමැත. මෝටර් රථ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(vii) 2011.10.01 දින සමාගම විසින් එහි සියලු ම ජංගම නොවන වත්කම් රක්ෂණය කළ අතර 2012.09.30 දිනෙන් අවසන්වන එක් අවුරුදු කාලපරිච්ඡේදය සඳහා රු. 120 000 ක් රක්ෂණ වාරික ලෙස ගෙවා ඇත. ගෙවූ වාරිකය පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත.

(viii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් බදු, බදුපෙර ලාභයෙන් 1/3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ix) වර්ෂය සඳහා රු. 150 000 ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කර ඇත.

(x) රඳවාගත් ඉපැයුම්වලින් රු. 1 000 000 ක් මාරුකර වසර අවසානයේ දී පොදු සංචිතයක් ඇති කිරීමට තීරණය කර ඇත.

අවශ්‍යවන්නේ:

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත පර්ල් පොදු සමාගමේ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

(1) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් ප්‍රකාශනය

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2012.03.31 දිනට ශේෂ පත්‍රය ***(ලකුණු 20 යි)***

(1)

සීමිත පර්ල් පොදු සමාගම
2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)
ආදායම් ප්‍රකාශය

	සටහන්		(රු'000)	
විකුණුම්			4800	
විකුණුම් පිරිවැය			(1550)	(02) → පෙර වැඩ බලන්න
දළ ලාභය			3250	(01)
බෙදා හැරීමේ වියදම්		1000 (03)		
පරිපාලන වියදම්		840 (02)		→ පෙර වැඩ බලන්න
මූල්‍ය වියදම්		150 (01)		
			(1990)	
බදු පෙර ලාභය	01		1260	
ආදායම් බදු		(02)	(420)	
වර්ෂයේ ලාභය (01)			840	

සටහන් අංකය 01

බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් අඩු කිරීමෙන් පසුවය.

මූල්‍ය කල්බදු පොලී	**100**
ජංගම නොවන වත්කම් ක්ෂය	**900**
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන	**60**
මූල්‍ය වියදම්	**50**

(වටිනාකමත් සමග ඕනෑම අයිතම දෙකක් සඳහා ලකුණු 02)
(ලකුණු 15)

පෙර වැඩ (රු'000) :

විකුණුම් පිරිවැය			බෙදා හැරීමේ වියදම්	
ආරම්භක තොගය	500		බෙදා හැරීමේ වියදම්	450 (01)
ගැනුම්	1500	(01)	අඩමාණ ණය අධිවෙන් කිරීම	(10) (01)
	2000		වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන	60 (01)
අවසාන තොගය	(450)	(01)	මෝටර් රථ ක්ෂය	500
	1550			1000

පරිපාලන වියදම්			මූල්‍ය වියදම්	
පරිපාලන වියදම්	500		මූල්‍ය වියදම්	50
ඉදිරියට ගෙවූ රක්ෂණ	(60)	440 (01)	කල්බදු පොලී	100 (01)
ලී බඩු ක්ෂය	400	(01)		150
	840			

(2) **සීමිත පර්ල් පොදු සමාගම**
2012.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(රු'000)

	සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය (01)	පොදු සංචිතය	රඳවාගත් ඉපැයුම්	එකතුව
2011.04.01 ශේෂය	2000	-	-	1200	3200
වර්ෂයේ ලාභය	-	-	-	(01) 840	840
කොටස් නිකුත් කිරීම	1000 (01)	-	-		1000
ඉඩම් ප්‍රත්‍යාගණන ලාභය	-	300 (01)	-	(01) -	300
පොදු සංචිතයට මාරු කිරීම	-	-	1000	(1000)	
2012.03.31 ශේෂය	3000	300	1000	1040	5340

(01)

(ලකුණු 06)

(3)

සීමිත පර්ල් පොදු සමාගම
2012.03.31 දිනට ශේෂ පත්‍රය (01)

	සටහන්		(රු'000)	
ජංගම නොවන වත්කම්			7700 (02)	ලද අගය මාරුකර ඇතිවිට (01)
දේපල පිරියත හා උපකරණ	02			
ජංගම වත්කම්				
තොගය		450 (01)		
ණයගැතියෝ		360 (01)		
ඉදිරියට ගෙවූ රක්ෂණ වාරික		60 (01)		
මුදල් සහ මුදල් සමාන දෑ		150	1020	
හිමිකම් හා වගකීම්			8720	
ප්‍රකාශිත ප්‍රාග්ධනය				
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය			3000 (01)	
සංචිත				
ප්‍රත්‍යාගණන සංචිතය		300		
පොදු සංචිතය	(01)	1000		
රඳවා ගත් ඉපයුම්		1040	2340	
ජංගම නොවන වගකීම්				
කල්බදු ණයහිමියෝ			1500 (01)	
ජංගම වගකීම්				
වෙළඳ ණයහිමියෝ		900 (02)		
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		60 (01)		
කල්බදු ණයහිමියෝ		500 (01)		
ගෙවිය යුතු ආදායම් බදු	(01)	420	1880	
			8720	

සටහන් අංකය 02

දේපල, පිරියත සහ උපකරණ

(රු'000)


	ඉඩම්	ලී බඩු	මෝටර් රථ	එකතුව
පිරිවැය/අගය				
2011.04.01 දිනට ශේෂය	2200	4000	-	6200
එකතු කිරීම	-	-	2500 (01)	2500
ප්‍රත්‍යාගණන සඳහා ගැලපුම්	300 (01)	-	-	300
2012.03.31 දිනට ශේෂය	2500	4000	2500	9000
ක්ෂය :				
2011.04.01 දිනට ශේෂය	-	400	-	400
වර්ෂයේ ක්ෂය	-	400 (01)	500 (01)	900
2012.03.31 දිනට ශේෂය	-	800	500	1300
2012.03.31 දිනට ධාරණ වටිනාකම	2500	3200	2000	7700

2012.03.31 දින වෘත්තිය තක්සේරුකරුවකු විසින් ඉඩම් රු 2,500,000කට ප්‍රත්‍යාගණනය කරන ලදී.


සටහන් 03

සාමාන්‍ය කොටස් සඳහා රු 150,000ක අවසාන ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කර ඇත. (01) (ලකුණු 19)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
1 ප්‍රශ්නය අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 97%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 31%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට කොටස් 3ක් ඇත.
ඉන් 1 වන කොටසට පිළිතුරු සැපයූ අයගෙන් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 52% පමණි.

1 (1) කොටසේ පහසුතාව 52% වන අතර ඊට හේතු ලෙස ප්‍රධාන වශයෙන් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගැනීම, වාර්තා කළ කාලච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැතිවීම නිසා වර්ෂය තුළ දී යෝජනා කරන ලද රු.150,000ක අවසාන ලාභාංශය මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබීම සිසුන් කර ඇති දෝෂයක් ලෙස දැක්විය හැකිය. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ අවබෝධය අඩු මට්ටමක පවතින බැවින් එම ප්‍රමිත පිළිබඳ අවබෝධය තහවුරු වන ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

1 (3) කොටසේ ශේෂ පත්‍රයට අදාළ ව මූල්‍ය කල්බදු යටතේ ගනු ලැබූ මෝටර් රථය වත්කමක් ලෙස හඳුනා නොගැනීම, කල්බදු වාරිකය වෙළඳ ණයහිමි ගිණුමට හර කිරීමෙන් ඇති වූ වරද නිවැරදි කර නොගැනීම, කල්බදු ණයහිමි ශේෂය; ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් වශයෙන් පැහැදිලි ව බෙදා වෙන් කර නොගැනීම ආදී දුර්වලතා පවතින බව පෙනේ. මූල්‍ය කල්බදු යටතේ ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බැවින් ඒ පිළිබඳ දැනුම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ලබාදිය යුතුය.

02 ප්‍රශ්නය

2. (අ) ලාභඅලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදගන්නා **පැතුම්** සහ **රොමේෂ්** උපදේශන ආයතනයක හවුල්කරුවෝ වූහ. 2011.03.31 දිනට මෙම හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත පරිදි වේ.

	රු. '000	රු. '000
ජංගම නොවන වත්කම්		
දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට	1 300	
සමුච්චිත ක්ෂය	(260)	1 040
ජංගම වත්කම්		
තොගය-ලිපිද්‍රව්‍ය	100	
ලැබිය යුතු උපදේශන ගාස්තු	300	
මුදල්	60	460
		1500
ප්‍රාග්ධන ගිණුම්		
පැතුම්	600	
රොමේෂ්	400	1000
ජංගම ගිණුම්		
පැතුම්	150	
රොමේෂ්	150	300
ජංගම වගකීම්		
උපචිත කාර්යාල වියදම්		200
		1500

අතිරේක තොරතුරු :

(i) 2011.04.01 දින නව හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට **සඳුන්** බඳවා ගන්නා ලද අතර ඔහු විසින් රු. 400 000 ක් මුදලින් ප්‍රාග්ධනය ලෙස දායක විය. 2011.04.01 දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර ඒ සඳහා සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් කළ යුතු ය. පහත දක්වෙන්නේ පැතුම්, රොමේෂ් සහ සඳුන් නව හවුල් ව්‍යාපාර ගිවිසුමේ එකහතා ය.

(අ) සෑම හවුල්කරුවකුට ම රු. 10 000 ක මාසික වේතනයක් හිමි ය.

(ආ) ලාභඅලාභ පිළිවෙළින් 2:2:1 අනුපාතයට පැතුම්, රොමේෂ් සහ සඳුන් අතර බෙදා හැරේ.

(ii) 2012.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ සිදු වූ මුදල් ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ.

	රු.'000
ලැබීම්	
උපදේශන ගාස්තු (2011.03.31 දිනට ලැබිය යුතු ප්‍රමාණය ද ඇතුළුව)	1 300
හවුල්කරුවකු ලෙස බඳවා ගැනීමේ දී සඳුන්ගෙන් ලද මුදල	400
ගෙවීම්	
ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම්	200
කාර්යාල සේවකයන්ගේ වේතන	140
කාර්යාල වියදම්	400
ගැනිලි:	
පැතුම්	125
රොමේෂ්	110
සඳුන්	105
ස්ථිර තැන්පතුවක 2011.10.01 දින තැන්පත් කළ මුදල (12% ක වාර්ෂික පොලියට වසරක කාලයක් සඳහා)	500

(iii) දේපල, පිරියත සහ උපකරණ වාර්ෂිකව, පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) 2012.03.31 දිනට ජංගම වත්කම් සහ ජංගම වගකීම්:

(අ) තොගය - ලිපිද්‍රව්‍ය	රු. 50 000.
(ආ) ලැබිය යුතු උපදේශන ගාස්තු	රු. 500 000.
(ඉ) උපචිත කාර්යාල වියදම්	රු. 150 000.

අවශ්‍යවන්නේ:

පැතුම්, රොමේෂ් සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් ද

(1) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන විසර්ජන ද ඇතුළුව)

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(ලකුණු 10 යි)

(ආ) එකලස් සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ ගබඩාවක් සීමිත රොෂාන් පොදු සමාගමට ඇත. සමාගම එම 'කුඩා ප්‍රමාණයේ' සහ 'විශාල ප්‍රමාණයේ' ලෙස වර්ග දෙකක බෝනික්කන් නිෂ්පාදනය කරයි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඒවා නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක හරහා ගමන් කරයි. පහත තොරතුරු දී ඇත.

අයවැයගත වාර්ෂික පොදු කාර්ය පිරිවැය:

	රු.
කම්හල් කුලී	120 000
යන්ත්‍ර ක්ෂය	80 000
සේවක රක්ෂණ වාරික	50 000
වත්‍ර අමුද්‍රව්‍ය - එකලස්	106 000
- නිමැවුම්	59 000
- ගබඩා	11 000

අදාළ වෙනත් තොරතුරු:

(i)	**එකලස්**	**නිමැවුම්**	**ගබඩාව**
යන්ත්‍ර පිරිවැය (රු.)	300 000	500 000	–
බිම් ප්‍රමාණය (වර්ග මීටර)	10 000	6 000	4 000
සේවක සංඛ්‍යාව	60	30	10
අයවැයගත යන්ත්‍ර පැය	5 000	2 000	–
අයවැයගත ශ්‍රම පැය	2 000	8 000	–

(ii) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවලට පිළිවෙළින් 60% ක් සහ 40% ක් ලෙස ගබඩාව සේවා සපයයි.

(iii) පහත පදනම්වලට අනුව පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරෙයි:

එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැය

නිමැවුම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැය

(iv) ඒකකයක් සඳහා අවශ්‍ය පැය (විශාල ප්‍රමාණයේ බෝනික්කකුට):

යන්ත්‍ර පැය: එකලස් දෙපාර්තමේන්තුව පැය 4

ශ්‍රම පැය: නිමැවුම් දෙපාර්තමේන්තුව පැය 5

(v) විශාල ප්‍රමාණයේ බෝනික්කකු නිෂ්පාදනය කිරීමට අදළ සත්‍ය සෘජු පිරිවැය:

සෘජු අමුද්‍රව්‍ය රු. 100

සෘජු ශ්‍රමය රු. 150

(vi) විශාල ප්‍රමාණයේ බෝනික්කකුගේ විකුණුම් මිල රු. 600 කි.

අවශ්‍යවන්නේ:

(1) විභාජන පදනම දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ගබඩාවේ පොදු කාර්ය පිරිවැය නැවත විභාජනය ද ඇතුළුව)

(2) විශාල ප්‍රමාණයේ බෝනික්කකුගේ නිෂ්පාදන පිරිවැය

(3) විශාල ප්‍රමාණයේ බෝනික්කන් 200 ක් විකිණීමෙන් ලැබිය හැකි ලාභය හෝ අලාභය ***(ලකුණු 10 යි)***

(මුළු ලකුණු 20 යි)

02. (අ) (1)

පැතුම්, රොමේෂ් සහ සඳුන් හවුල් ව්‍යාපාරය
2012.03.31 දිනෙන් අවසන් වර්ෂය
සඳහා ආදායම් ප්‍රකාශය

(රු'000)

උපදේශන ආදායම		1500	(02) ← පෙර වැඩ බලන්න
වෙනත් ආදායම් - ස්ථාවර තැන්පතු පොලී		30	(01)
		1530	
මෙහෙයුම් වියදම්			
පරිභෝජනය කළ ලිපිද්‍රව්‍ය පිරිවැය	250 (02)		
කාර්යාල සේවක වේතන	140		} පෙර වැඩ බලන්න
කාර්යාල වියදම්	350 (02)		
ක්ෂයවීම් - දේපල, පිරියත සහ උපකරණ	260 (01)	(1000)	
ශුද්ධ ලාභය		530 (01)	
වේතන - පැතුම්	120		
රොමේෂ්	120 (01)		
සඳුන්	120	(360)	
ලාභ කොටස් - පැතුම්			
රොමේෂ්	68		
සඳුන්	68 (02)		← ලද අගය අනුව නිවැරදි අනුපාතයට ලාභය බෙදීම (01)
	34	(170)	

(ලකුණු 12)

පෙර වැඩ (රු'000)

1. උපදේශන ගාස්තු		
උපදේශන ගාස්තු ලැබීම්	1300	
2011.03.31 දිනට ලැබිය යුතු	(300)	(01)
2012.03.31 දිනට ලැබිය යුතු	500	(01)
	1500	
2. පාරිභෝජනය කළ ලිපිද්‍රව්‍ය		
ආරම්භක තොගය	100	} (01)
ගැනුම්	200	
	300	
අවසාන තොගය	(50)	(01)
	250	
3. කාර්යාල වියදම්		
මුදලින් ගෙවූ	400	} (01)
ආරම්භක ශේෂය	(200)	
වර්ෂ අග ශේෂය	150	(01)
	350	

(අ) (2)

ප්‍රාග්ධන ගිණුම

(රු'000)

	පැතුම්	රොමේෂ්	සඳුන්		පැතුම්	රොමේෂ්	සඳුන්
* කීර්තිනාමය	400	400	200 (01)	ශේෂය ඉ/ගෙ	600	400	-
ශේෂය ප/ගෙ	800	400	200	මුදල්	-	-	400 (01)
			(01)	* කීර්තිනාමය	600	400	- (01)
	1200	800	400		1200	800	400
				ශේෂය ඉ/ගෙ	800	400	200

* කීර්තිනාමය ශුද්ධ බලපෑම ද වාර්තා කළ හැක.

ජංගම ගිණුම

(රු'000)

	පැතුම්	රොමේෂ්	සඳුන්		පැතුම්	රොමේෂ්	සඳුන්
ගැනිලි	125	110	105 (01)	ශේෂය ඉ/ගෙ	150	150	-
(01)				වේතන (01)	120	120	120
ශේෂය ප/ගෙ	213	228	49	ලාභ කොටස් (01)	68	68	34
	338	338	154		338	800	154
				ඉ/ගෙ ශේෂය	213	228	49

(ලකුණු 08)

(ආ) (1) පොදු කාර්ය විභාජන පත්‍රිකාව

(රු'000)

අයිතමය	විභාජන පදනම	මුළු වටිනාකම	එකලස්	නිමැවුම්	ගබඩාව
වක්‍ර අමුද්‍රව්‍ය	සෘජු	176	106	59	11 (01)
කම්හල් කුලී	(01) බිම් ප්‍රමාණය/ (10:6:4)	120	60	36	24 (01)
යන්ත්‍ර ක්ෂය	(01) යන්ත්‍ර පිරිවැය/ (3:5)	80	30	50	- (01)
සේවක රක්ෂණය	(01) සේවක සංඛ්‍යාව/ (6:3:1)	50	30	15	5 (01)
එකතුව		426	226	160	40
ගබඩාව	6:4		24 (01)	16 (01)	(40)
		426	250	176	-

(01)

(* වටිනාකම විභාජන පදනම මත නියමිත අනුපාතයට බෙදා ඇතිවිට පමණක් ලකුණු ලැබේ.)

(ලකුණු 10)

(ආ) (2) විශාල බෝනික්කකුගේ නිෂ්පාදන පිරිවැය : රු 560 (ලකුණු 07)

පෙර වැඩ (රු.)

(1) ඍජු අමුද්‍රව්‍ය = 100
ඍජු ශ්‍රමය = 150
ප්‍රාථමික පිරිවැය = 250 (01)

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

එකලස් (02) (01) 50 × 4 = 200

නිමැවුම් (02) (01) 22 × 5 = 110 = 310

මුළු නිෂ්පාදන පිරිවැය = 560

(2) එකලස් අංශයේ අන්තර්ග්‍රහණ අනුපාතය* = [01] 250000 / 5000 [01] = යන්ත්‍ර පැයකට රු 50

නිමැවුම් අංශයේ අන්තර්ග්‍රහණ අනුපාතය* = [01] 176000 / 8000 [01] = ශ්‍රම පැයකට රු 22


(ආ) (3) බෝනික්කන් 200ක් විකිණීමේ ලාභය = රු 8000 (ලකුණු 03)

පෙරවැඩ (රු.) :


විකුණුම් (200 × 600)	=	120000 (01)
නිෂ්පාදන පිරිවැය (200 × 560)	=	(112000) (01)
ලාභය	=	8000

විකල්පය : 200 x 40 (01) = 8000

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
2 ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 96%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ට වඩා ලබාගත් පිරිස 29%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අනුකොටස් 5ක් ඇති අතර එම අනුකොටස් පහේම පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වන අතර එහි පහසුතාවය 74%කි. පහසුතාව අඩුම අනුකොටස (අ) (1) වේ. එහි පහසුතාව 48%කි.

2 ප්‍රශ්නයේ (අ) (1) හා (අ) (2) කොටස්වල පහසුතා පිළිවෙළින් 48%ක් හා 66%ක් වේ. ආයතනය සේවා සපයන හවුල් ව්‍යාපාරයක් බව අවබෝධ කර නොගැනීම හේතුවෙන් ලිපිද්‍රව්‍ය තොග, වෙළඳ තොග වශයෙන් හඳුනාගෙන ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම, උපදේශන ආදායම් උපචිත සංකල්පයට අදාළ ව නිවැරදිව ගළපා නොතිබීම යන දුර්වලතා සිදුව ඇත. වෙළඳ ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනයේත්, සේවා සපයන ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනයේත් වෙනසක් පවතින බව සිසුවාට අවබෝධ වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. උපචිත සංකල්පයට අනුව වර්ෂයට අදාළ ආදායම් හා වර්ෂයට අදාළ වියදම් ගණනය කිරීම පිළිබඳ අවබෝධයක් ලබාදෙන ආකාරයට සිසුන්ට ඉගැන්වීම කළ යුතුය.

(ආ) (2) හා (ආ) (3) කොටස්වල පහසුතා පිළිවෙළින් 59%ක් හා 50%ක් වේ. පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීමේ අවබෝධය අඩුවීම, මුළු පිරිවැය ගණනය කිරීමේදී පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ අවබෝධය අඩුවීම සහ ලාභය/අලාභය ගණනය කිරීම දුර්වල මට්ටමක පැවතීම මෙයට හේතු විය හැක. පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත හා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය පිළිබඳ අඩු සාධන මට්ටමක් පවතින බැවින්, පොදු කාර්යය පිරිවැය බෙදා හැරීම සහ අන්තර්ග්‍රහනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ව අවබෝධය තහවුරු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

3. **(අ)** 2012.03.31 දිනට ව්‍යාපාරයක මුදල් පොතේ රු. 20 000 ක හර බැංකු ශේෂයක් පෙන්නුම් කරන ලදී. මෙදිනට රු. 10 000 ක බැංකු අයිරාවක් බැංකු ප්‍රකාශනයේ ශේෂය ලෙස පෙන්වන ලදී. පසුව කරන ලද විමර්ශනවල දී පහත ද අනාවරණය විය.

(i) බැංකුවේ තැන්පත් කළ රු. 80 000 ක වෙක්පත් උපලබ්ධි වී නොමැත.

(ii) සැපයුම්කරුවන්ට නිකුත් කළ රු. 40 000 ක වෙක්පත් ගෙවීමට ඉදිරිපත් කර නොමැත.

(iii) බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 25 000 ක ස්ථාවර තැන්පත් මත පොලිය මුදල් පොතේ වාර්තා වී නොමැත.

(iv) බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවූ රු. 5 000 ක රක්ෂණ වාරිකය මුදල් පොතේ වාර්තා වී නොමැත.

(v) තැන්පත් කළ රු. 10 000 ක වෙක්පතක් බැංකුව විසින් අගරු කර ඇති අතර ඒ සඳහා කිසිදු සටහනක් මුදල් පොතේ සිදුකර නොමැත.

අවශ්‍යවන්නේ :

(1) 2012.03.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය

(2) 2012 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය ***(ලකුණු 05 යි)***

(ආ) 2012.01.01 දිනට කේවල ස්වාමි ව්‍යාපාරයක් වූ දිලානි වෙළඳ ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත දී ඇත.

2012.01.01 දිනට ශේෂ පත්‍රය

	රු.'000
වත්කම්	
ලී බඩු සහ සවිකිරීම් (පිරිවැය රු. 180 000)	120
තොගය	70
ණයගැතියෝ	10
මුදල්	30
එකතුව	**230**
හිමිකම	180
වගකීම්	
ණයහිමියෝ	50
එකතුව	**230**

2012 ජනවාරි මාසයේ දී පහත සඳහන් ගනුදෙනු සහ සිද්ධි සිදුවිය.

අංකය	ජනවාරි දිනය	ගනුදෙනුව / සිද්ධිය
(i)	04	භාණ්ඩ අත්පිට මුදලට රු. 40 000 කට විකුණන ලදී. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30 000 කි.
(ii)	08	රු. 35 000 ක වටිනාකම ඇති භාණ්ඩ ණයට ගන්නා ලදී.
(iii)	12	2012.01.08 දින මිල දී ගත් රු. 5 000 ක භාණ්ඩ නැවත සැපයුම්කරු වෙත යවන ලදී.
(iv)	15	භාණ්ඩ ණයට රු. 50 000 කට විකුණන ලදී. මෙම භාණ්ඩවල පිරිවැය රු. 40 000 කි.
(v)	18	ණයගැතියන්ගෙන් රු. 9 000 ක මුදල් ලද අතර රු. 1 000 ක් බොල්ණය ලෙස කපා හරින ලදී.
(vi)	20	රු. 12 000 ක් සේවකයන්ගේ වැටුප් ලෙස ගෙවන ලදී.
(vii)	25	2012.01.01 දිනට ණයහිමි ශේෂය පියවීමට මුදල් ගෙවූ අතර රු. 5 000 ක මුදල් වට්ටම් ලැබුණි.
(viii)	28	පෞද්ගලික පරිහරණය සඳහා රු. 5 000 ක මුදලක් අයිතිකරු විසින් ලබා ගන්නා ලදී.
(ix)	30	2012.01.18 දින කපාහල බොල් ණය මුදලින් ලැබුණි.
(x)	31	ජනවාරි මාසය සඳහා ලී බඩු සහ සවිකිරීම් සඳහා රු. 3 000 ක ක්ෂය වෙන්කරන ලදී.

අවශ්‍යවන්නේ :

(1) ඉහත ගනුදෙනු සහ සිද්ධිවල බලපෑම (අගයන් ද සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (−) ද යන්න සඳහන් කිරීම (පහත ආකෘතිය භාවිත කරන්න).

අංකය	වත්කම්				වගකීම්	හිමිකම්
	ලී බඩු සහ සවිකිරීම්	තොගය	ණයගැතියෝ	මුදල්	ණයහිමියෝ	
(i)						
(ii)						
...						
...						

(2) ශුද්ධ වත්කම් පදනම මත 2012 ජනවාරි මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය හෝ ගණනය කිරීම

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

03. (අ) (1) 2012.03.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය = රු 30000 (ලකුණු 04)

පෙර වැඩ (රු'000) :

මුදල් පොත					
ශේෂය ඉ/ගෙ	20	(01)	රක්ෂණ වාරිකය	5	(01)
ස්ථාවර තැන්පතු පොලී	25	(01)	අගරු වූ චෙක් පත්	10	(01)
			ශේෂය ප/ගෙ	30	
	45			45	
ශේෂය ඉ/ගෙ	30				

(අ) (2) 2012 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය

		(රු'000)	
මුදල් පොතට අනුව සංශෝධිත ශේෂය	(01)	30	
එකතු කළා :-			
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත්		40	(02)
		70	
අඩු කළා :-			
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්		(80)	(02)
2012 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය (හර)/අයිරාව		(10)	(01)

(ලකුණු 06)

(ආ) (1)

(රු'000)


අංකය	වත්කම්				වගකීම්	හිමිකම්	
	ලීබඩු සහ සවිකිරීම්	තොගය	ණයගැතියෝ	මුදල්	ණයහිමියෝ		
ආරම්භක ශේෂය	120	70	10	30	50	180	
(i)		-30		+40		+10	(02)
(ii)		+35			+35		(01)
(iii)		-5			-5		(01)
(iv)		-40	+50			+10	(02)
(v)			-10	+9		-1	(02)
(vi)				-12		-12	(01)
(vii)				-45	-50	+5	(02)
(viii)				-5		-5	(01)
(ix)				+1		+1	(01)
(x)	-3					-3	(01)
අවසාන ශේෂය	117	30	50	18	30	185	

(ලකුණු 14)


(ආ) (2) ශුද්ධ ලාභය රු. 10000 (ලකුණු 06)

පෙර වැඩ (රු.) : (03) 185000 - (01) 180000 + (02) 5000
= 10000

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
3 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 93%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලබාගත් පිරිස 49%ක් වන අතර ලකුණු 7 හෝ ඊට වඩා අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 8%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 4 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (අ) (1) වන අතර එහි පහසුතාව 93%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස (ආ) (2) වන අතර එහි පහසුතාව 52% කි.

(අ) (1) හා (අ) (2) අනුකොටස් සඳහා පහසුතා පිළිවෙළින් 93%ක් හා 87%ක් වේ. මෙම අනුකොටස් සඳහා සිසුන් ඉහළ සාධන මට්ටමක් පෙන්වා ඇත. (ශුද්ධ වත්කම් පදනම මත ලාභය/අලාභය සෙවීම පිළිබඳ අවබෝධය දුර්වල බව දක්නට ලැබුණි. ශුද්ධ ලාභය/අලාභය සෙවීම සඳහා ආදායම් ප්‍රකාශය ඇසුරෙන් මෙන්ම, ශුද්ධ වත්කම් ඇසුරෙන් ද සෙවිය හැකි බැවින් ඉහත ක්‍රම දෙක පිළිබඳ ව ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ට අවබෝධය ලබාදිය යුතුය.)

(ආ) (2) අනුකොටස සඳහා පහසුතාව 52%කි. තවද මෙම අනුකොටස සිසුන්ගෙන් මඟහැරියාමක් හෝ අත්හැරීමක් සිදුනොවූනේ නම් සිසුන්ගේ සාධන මට්ටම ඉහළයාමට තිබුණි. එමනිසා ප්‍රශ්න පත්‍රයේ සියලු ම කොටස් කියවා අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට සිසුන් හුරුකළ යුතුය.

4. **(අ)** 2011.03.31 දිනට සීමිත කමලන් පොදු සමාගමේ දේපල, පිරියත සහ උපකරණ අයිතම දෙකක් සම්බන්ධ ව පහත තොරතුරු අදළ වේ.

වත්කම්	පිරිවැය (රු.'000)	ධාරණ වටිනාකම (රු.'000)	අපේක්ෂිත ඵලදායී ජීවකාලය (වසර)
ගොඩනැගිලි	2 000	1 000	20
කාර්යාලීය උපකරණ	500	400	5

මෙම වත්කම් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. (ඒවායේ සුන්බුන් අගය නොසලකා හරින්න.) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී මෙම වත්කම් සම්බන්ධයෙන් පහත ගනුදෙනු සහ සිද්ධි සිදුවිය.

දිනය	ගනුදෙනුව / සිද්ධිය
2011.04.01	රු. 800 000 ක් වැය කරමින් ගොඩනැගිලි නවීකරණය කරන ලදී. එම නිසා ගොඩනැගිලිවල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 15 ක් ලෙස නැවත ඇස්තමේන්තු කරන ලදී.
2012.03.31	දැනට පවතින කාර්යාල උපකරණ භුවමාරු කරගනිමින් සහ අමතරව රු. 300 000 ක මුදලක් ගෙවා නව කාර්යාල උපකරණ රු. 600 000 කට මිල දී ගන්නා ලදී. නව උපකරණයේ අපේක්ෂිත ජීවකාලය වසර 5 කි.

අවශ්‍යවන්නේ:

(1) ඉහත ගනුදෙනු සහ සිද්ධි සටහන් කිරීමට ජර්නල් සටහන් (මුදල් ද සහිතව)

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට ඉහත ගනුදෙනු සහ සිද්ධිවල බලපෑම

(ලකුණු 05 යි)

(ආ) **අතුල, කමල්** සහ **එරන්ද** සමාගමක සේවකයින් තිදෙනෙකි. ඔවුන්ගේ වැටුප් සම්බන්ධ ව 2012 මාර්තු මාසය සඳහා පහත තොරතුරු දී ඇත.

(i) වැඩකරන ලද පැය ගණන:

සේවකයා	සතියේ දින	සති අන්තය
අතුල	40	–
කමල්	40	10
එරන්ද	40	20

(ii) පැයකට රේටයන්:

- සතියේ දින සඳහා රේටය - පැයකට රු. 200 බැගින්
- සති අන්තය සඳහා අතිකාල ගෙවීම් - සතියේ දිනක පැයක රේටය මෙන් එක හමාරකි

(iii) සේව්‍යයා සහ සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) කරන දායකය පිළිවෙළින් 15% ක් සහ 10% කි. සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍යයාගේ දායකය 3% කි. EPF සහ ETF ගණනය සඳහා අතිකාල ගෙවීම් සැලකිල්ලට නොගනී.

(iv) අඩු කිරීම්:

- සුභසාධක අරමුදලට මාසික සේවක දායකය - රු. 200 (එක් සේවකයකුට)
- එරන්දගේ මාසික ණය වාරිකය - රු. 4 000

අවශ්‍යවන්නේ:

(1) 2012 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

(2) 2012 මාර්තු මාසය සඳහා වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු EPF ගිණුම සහ ගෙවිය යුතු ETF ගිණුම

(3) 2012 මාර්තු මාසය සඳහා සේවකයින්ට අදළ මුළු වියදම

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

04. (අ) (1) පොදු ජ'නලය

(රු'000)

විස්තරය	හර	බැර
ගොඩනැගිලි ගිණුම	800	
මුදල්/බැංකු ගිණුම		800 (01)
(ගොඩනැගිලි නවීකරණ වියදම් සටහන් කිරීම)		
ගොඩනැගිලි ක්ෂයවීම් ගිණුම	120	
ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් ගිණුම		120 (02)
(ගොඩනැගිලි වාර්ෂික ක්ෂයවීම් සටහන් කිරීම.)		
කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම	500	
කාර්යාල උපකරණ ගිණුම		500 (01)
(ඉවත් කළ කාර්යාල උපකරණවල පිරිවැය ගිණුම්ගත කිරීම)		
කාර්යාල උපකරණ ක්ෂයවීම් ගිණුම	100	
කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීම් ගිණුම		100 (01)
(කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂයවීම් සටහන් කිරීම)		
කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීමේ ගිණුම	200	
කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම		200 (01)
(ඉවත් කළ කාර්යාල උපකරණවලට අදාළ ක්ෂය වෙන් කිරීම් ගිණුම්ගත කිරීම)		
කාර්යාල උපකරණ ගිණුම	600	
කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම		300
මුදල්/බැංකු ගිණුම		300 (02)
(කාර්යාල උපකරණ හුවමාරු අගය හා ගෙවූ මුදල සටහන් කිරීම)		

* සංලක්ෂය ලියා නොමැති විට ලද ලකුණුවලින් 2ක් අඩු කෙරේ. **(ලකුණු 08)**

(අ) (2) රු. 220,000/120,000 (ලකුණු 02)

පෙරවැඩ (රු.) :	
ගොඩනැගිලි	120,000/20,000 (01)
කාර්යාල උපකරණ	100,000/100,000 (01)
	220,000/120,000

(ආ) (1) 2012 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

(රු.)

අනු අංකය	සේවකයාගේ නම	මූලික වැටුප	අතිකාල දීමනා	දළ වැටුප	අඩු කිරීම්			මුළු අඩු කිරීම්	ශුද්ධ වැටුප	සේව්‍යයා	
					EPF	සුභ සාධන	ණය වාරික			EPF	ETF
01	අතුල	8000	-	8000	800	200	-	1000	7000 (01)	1200	240
02	කමල්	8000	3000 (01)	11000	800 (01)	200	-	1000	10000 (01)	1200 (01)	240 (01)
03	එරන්ද	8000	6000 (01)	14000	800	200	4000	5000	9000 (01)	1200	240
		24000	9000	33000	24000	600	4000	7000	26000	3600	720

(02)

(ලකුණු 10)

(ආ) (2)

වැටුප් පාලන ගිණුම

සේවක අර්ථසාධක අරමුදල	2400	(01)	වැටුප්	33000	(01)
සුභ සාධක අරමුදල	600	(01)			
ණයවාරික	4000	(01)			
මුදල්/බැංකු/ගෙවිය යුතු වැටුප්	26000	(01)			
	33000			33000	

ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම

ශේෂය ප/ගෙ	6000	වැටුප් පාලන	2400	(01)
		සේවක අර්ථසාධක වියදම්	3600	(01)
	6000		6000	
		ශේෂය ඉ/ගෙ	6000	

ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල

ශේෂය ප/ගෙ	720	සේවක භාරකාර වියදම්	720	(01)
		ශේෂය ඉ/ගෙ	720	

(ලකුණු 08)

(ආ) (3) සේවකයන්ට අදාළ වියදම රු 37320

පෙර වැඩ (රු.) :			
	වැටුප් හා වේතන	33000	
	EPF වියදම්	3600	(01)
	ETF වියදම්	720	(01)
	සේවකයින්ට අදාළ මුළු වියදම	37320	

(ලකුණු 02)

විකල්ප පිළිතුර

(ආ) (1)

සේවකයින්	ඉපයීම්			අඩු කිරීම්			ශුද්ධ වැටුප	සේව්‍යයා	
	මූලික වැටුප	අතිකාල දීමනා	දළ වැටුප	EPF	සුභ සාධන	ණය		EPF	ETF
අතුල	32000	-	32000	3200	200	-	28600 (01)	4800	960
කමල්	32000	12000 (01)	44000	3200 (01)	200	-	40600 (01)	4800 (01)	960 (01)
එරන්ද	32000	24000 (01)	56000	3200	200	4000	48600 (01)	4800	960
	96000	36000	132000	9600	600	4000	117800	14400	2880

(02)

(ලකුණු 10)

(ආ) (2)

වැටුප් පාලන ගිණුම

සේවක අර්ථසාධක අරමුදල්	9600	(01)	වැටුප්	132000	(01)
ශුභ සාධක	600	(01)			
ණය	4000	(01)			
මුදල්/බැංකු/ගෙවිය යුතු වැටුප්	117800	(01)			
	126000			126000	

ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම

ප/ගෙ ශේෂය	24000	වැටුප් පාලන	9600	(01)
		සේව්‍ය	14400	(01)
	24000		24000	
		ඉ/ගෙ ශේෂය	24000	

ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම

ප/ගෙ ශේෂය	2880	සේවක භාරකාර වියදම්	2880	(01)
		ඉ/ගෙ ශේෂය	2880	


(ලකුණු 08)

(ආ) (3) සේවකයන්ට අදාළ වියදම රු 149280

පෙර වැඩ (රු) :			
	වැටුප්	132000	
	EPF	14400	(01)
	ETF	2880	(01)
		149280	

(ලකුණු 02)


4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30 කි.
4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 75%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 30ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 19%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලබාගත් පිරිස 19%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 34%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 7 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 5න් කොටස් 3ක පහසුතාව 45%ට වඩා ඉහළ ය. පහසුතාව අඩුම අනුකොටස (අ) (2) වන අතර එහි පහසුතාව 34%ක් වේ. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වේ. එහි පහසුතාව 57% කි.

(අ) (1) අනුකොටස සඳහා පහසුතාව 36%කි. ගොඩනැගිලි සඳහා පසුකාලීනව දරන ලද නවීකරණ වියදම්, වත්කම්වල වටිනාකම ඉහළයාමක් ලෙස සිසුන් හඳුනාගෙන නොතිබීමත්, වැඩි සිසුන් පිරිසක් එය ගොඩනැගිලි අළුත්වැඩියා වියදමක් ලෙස හඳුනාගෙන තිබීමත් දක්නට ලැබුණි. ඉහත සංකල්පය නිවැරදි නොවූ නිසා වාර්ෂික ක්ෂය නිවැරදි ව ගණනය කර නොතිබුණි. ප්‍රශ්නය නිවැරදිව කියවා අවබෝධ කර ගැනීම හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් සංකල්ප නිවැරදිව සිසුන්ට අවබෝධ කරවීම කළ යුතුය.

(අ) (2) අනුකොටස සඳහා පහසුතාව 34%කි. පහසුතාව අඩුවීමට හේතුවී තිබුණේ ලාභයට වූ බලපෑම ගණනය කිරීම නිවැරදි ව කර නොතිබීමය. LKAS 16ට අනුව පසුකාලීනව දරන ලද පිරිවැය අඳාළ වත්කමේ පිරිවැයෙහි කොටසක් ලෙස හඳුනාගත යුතු බවට අවබෝධයක් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ලබාදිය යුතුය. පසුකාලීන පිරිවැය නිවැරදි ව හඳුනා නොගැනීමෙන් වාර්ෂික ශුද්ධ ලාභය නිවැරදි ව ගණනය කිරීම සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදිය යුතුය.

(ආ) (3) අනුකොටස සඳහා පහසුතාව 47%කි. 2012 මාර්තු මාසය සඳහා සේවකයින්ට අදාළ මුළු වියදම ගණනය කිරීමේ දී වැටුප් වියදම පමණක් ගෙන තිබුණු අතර E.P.F. හා E.T.F. යන වියදම් එකතු කර නොතිබීමේ දුර්වලතාව දක්නට ලැබුණි. සේවකයින්ට අදාළ මුළු වැටුප් වියදම ගණනය කිරීමේදී වැටුප් වියදම පමණක් නොව ව්‍යාපාරය ඔවුන් වෙනුවෙන් වැටුප්වලට අදාළ ව දරන ලද අනෙකුත් වියදම් ද එකතු විය යුතු බව අවබෝධ කර දිය යුතුය.

5. (අ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සීමිත අම්ල පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	රු.'000
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	600
රඳවාගත් ඉපැයුම්	400
15% ණයකර	500
ජංගම වගකීම්	300
ජංගම නොවන වත්කම්	1 250
ජංගම වත්කම්:	
තොගය	300
(2011.04.01 දිනට තොගය රු. 500 000)	
ණයගැතියෝ	400
මුදල් සහ මුදල් සමාන ද	50
විකුණුම්	3 000
විකුණුම් පිරිවැය	2 200
වර්ෂය සඳහා ආදයම් බදු	200
වර්ෂයේ ලාභය	400

අවශ්‍යවන්නේ:

(1) ක්ෂණික අනුපාතය

(2) තොග පිරිවැටුම් අනුපාතය

(3) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

(4) ණය - හිමිකම් අනුපාතය

(5) පොලී ආවරණ අනුපාතය

(ලකුණු 05 යි)

(ආ) 2012.03.31 සහ 2011.03.31 දිනට සීමිත ගංගා පොදු සමාගමේ සාරාංශගත ශේෂ පත්‍ර පහත පරිදි වේ:

	2012.03.31 (රු.'000)	2011.03.31 (රු.'000)
ඉඩම්	1 250	1 600
ගොඩනැගිලි	250	150
ගොඩනැගිලි මත සමුච්චිත ක්ෂය	(115)	(90)
යන්ත්‍ර සූත්‍ර	400	400
යන්ත්‍ර සූත්‍ර මත සමුච්චිත ක්ෂය	(120)	(80)
තොගය	125	150
ණයගැතියෝ	750	600
බැංකුවේ ඇති මුදල්	100	70
එකතුව	**2 640**	**2 800**
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	800	800
රඳවාගත් ඉපැයුම්	480	300
දිගුකාලීන ණය (2011.03.31 දින ලබා ගත්)	800	1 000
ණයහිමියෝ	450	620
ගෙවිය යුතු පොලී	60	-
ගෙවිය යුතු ආදයම් බදු	50	80
එකතුව	**2 640**	**2 800**

අතිරේක තොරතුරු:

(i) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ලාභය රු. 200 000 කි.

(ii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු ණය පොලියෙන් බාගයක් පමණක් ගෙවා ඇත.

(iii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 100 000 ක් වැයකර ගොඩනැගිල්ලට නව කොටසක් එකතු කරන ලදී. තවද වර්ෂය තුළ දී සමාගම සතු ඉඩම් කැබැල්ලක් රු. 600 000 ක මුදලකට විකුණන ලදී.

(iv) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී යන්ත්‍ර සූත්‍ර කිසිවක් මිල දී ගෙන හෝ විකුණා හෝ නොමැත.

(v) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී කොටස් නිකුත් කිරීමක් හෝ ලාභාංශ ගෙවීමක් හෝ සිදුකර නොමැත.

අවශ්‍යවන්නේ:

අදළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

05. (අ) (1) ක්ෂණික අනුපාතය = වාර 1.5 (01) (3 : 2 හෝ 1.5 : 1)

(අ) (2) තොග පිරිවැටුම් අනුපාතය = වාර 5.5 (02)

පෙර වැඩ :

$$\frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

$$\frac{2200}{400} \quad (01)(01)$$

වාර 5.5

(අ) (3) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය = 23.75% (02)

පෙර වැඩ :

$$\frac{\text{බදු පසු ලාභය + පොලිය}}{(01)\ \text{මුළු වත්කම්}}$$

$$\frac{400 + 75}{2000\ (01)} \times 100$$

23.75%

(අ) (4) ණය හිමිකම් අනුපාතය = 0.5 හෝ 50% (02)

පෙර වැඩ :

$$\frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}}$$

$$\frac{500\ (01)}{1000\ (01)}$$

(අ) (5) පොලී ආවරණ අනුපාතය = වාර 9 (03)

පෙර වැඩ :

$$\frac{\text{බදු හා පොලී පෙර ලාභය}}{\text{පොලිය}}$$

$$\frac{400 + 200 + 75\ (01)(01)}{75\ (01)}$$

වාර 9

(ලකුණු 10)

(ආ)

සීමිත ගංගා සමාගම
2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (01)

රු'000'

මෙහෙයුම් ක්‍රියාකාරකම්			
බදු පෙර ලාභය	200	(01)	
ගැලපීම් :			
ක්ෂය	65	(02)	
ණය පොලිය	120	(01)	
ඉඩම් විකුණුම් ලාභය	(250)	(02)	
කාරක ප්‍රාග්ධන ගැලපුම් කිරීමට පෙර ලාභය	135		
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්:			
තොග අඩුවීම	25	(01)	
ණයගැතියෝ වැඩිවීම	(150)	(01)	
ණයහිමියෝ අඩුවීම	(170)	(01)	
	(160)		
ආදායම් බදු ගෙවීම්	(50)	(02)	← පෙර වැඩ බලන්න
ණය පොලි ගෙවීම්	(60)	(01)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)			(270)
ආයෝජන ක්‍රියාකාරකම්			
ඉඩම් විකිණීම	600	(01)	
ගොඩනැගිලි ඉදිකිරීම්	(100)	(01)	
ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)			500
මූල්‍ය ක්‍රියාකාරකම්			
දිගු කාලීන ණය ගෙවීම්	(200)	(01)	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			(200)
කාලච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/වෙනස (01)			30 (01)
2011.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ			70
2012.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ			100

(ලකුණු 20)


පෙර වැඩ : රු'000

ගෙවිය යුතු ආදායම් බදු ගිණුම


මුදල්	50	ශේෂය ඉ/ගෙ	80
		ආදායම් බදු	20
ශේෂයප/ගෙ	50		
	100		100

(අයිතම 2කට ලකුණු 01 බැගින් - ලකුණු 02)

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 62%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 6 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (අ) (2) වන අතර එහි පහසුතාව 69% කි. පහසුතාව අඩුම අනුකොටස (අ) (3) වන අතර එහි පහසුතාව 47%කි.

(අ) (3) අනුකොටස සඳහා පහසුතාව 47%ක් පමණි. මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීම පිළිබඳ ව සිසුන්ට මනා අවබෝධයක් නොතිබුණ අතර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් අනුපාත පිළිබඳ අවබෝධය ලබාදීමේදී අනුපාතයේ අන්තර්ගතය පිළිබඳ ව ද අවබෝධයක් ලබා දිය යුතුය.

(ආ) කොටස සඳහා පහසුතාව 51%කි. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී වසරේ ගෙවූ ආදායම් බදු ගණනය කිරීම පිළිබඳ ව සිසුන්ගේ සාධන මට්ටම දුර්වල මට්ටමක පැවති අතර වසරට අදාළ පොළී වියදම ගණනය කිරීම පිළිබඳ අඩු අවබෝධයක් තිබුණි. ප්‍රශ්නය තුළින් මතුවන තොරතුරුවලට අනුකූලව මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ ක්‍රමය (ඍජු/වක්‍ර) පිළිබඳ ඉගැන්වීමේදී සිසුන්ට මඟපෙන්වීමක් කළ යුතුය.

06 ප්‍රශ්නය

6. (අ) මහනුවර පාසලක වාණිජ සංගමය විසින් යාපනයට යෑමට තෙදින අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කෙරේ. සංගමයේ බැංකු ගිණුමේ රු. 20 000 ක ශේෂයක් ඇති අතර මෙම මුදල චාරිකාවට යොදා ගැනෙන බස්රථ කුලී ගෙවීම සඳහා යෙදවීමට සාමාජිකයෝ එකඟ වූහ.

පහත ඇස්තමේන්තු ද ලැබී ඇත.

බස් රථ සඳහා කුලිය	- එක් රථයකට රු. 45 000 බැගින් (බස් රථයකට සිසුන් 50 බැගින්)
සංචාරක නිවාස සඳහා දින 3 ට කුලී	- සංචාරක නිවාසයකට රු. 20 000 බැගින් (සංචාරක නිවාසයකට සිසුන් 25 බැගින්)
ආහාර සඳහා වියදම්	- සිසුවකුට දිනකට රු. 600 බැගින්
වතුර බෝතල් සඳහා වියදම්	- සිසුවකුට දිනකට රු. 200 බැගින්
අනෙකුත් වියදම්	- සිසුවකුට රු. 600 බැගින්

සිසුන් 100 දෙනකු චාරිකාවට සහභාගි වන බව උපකල්පනය කරන්න.

අවශ්‍යවන්නේ:

(1) සිසුන් 100 දෙනකුගෙන් සමවිඡේද මට්ටමට ළඟාවීමට නම්, එක සිසුවකුගෙන් අයකළ යුතු මුදල කොපමණ ද?

(2) අතිරික්තයක් තිබෙනම්, එම මුදල්, සංචාරය තුළ දී ආගමික ස්ථානවලට පරිත්‍යාග කිරීමට සංගමය බලාපොරොත්තු වේ. එක සිසුවකුගෙන් රු. 5 000 ක් අයකරනු ලැබුවේ නම්, පරිත්‍යාග කළ හැකි මුදල කොපමණ ද?

(ලකුණු 05 යි)

(ආ) තරුණයන්ගේ ඉංග්‍රීසි භාෂා හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් පවත්වාගෙන යන ලාභ නොලබන ආයතනයක් වන උදුර සුභසාධක සංගමයේ වාර්තාවලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

(i) 2012.03.31 දිනට සංගමයේ සාමාජිකයින් ගණන 50 ක් වූ අතර එක් අයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 2 000 කි.

(ii) සංගමයේ වත්කම් සහ වගකීම්:

	2012.03.31 දිනට (රු.'000)	2011.03.31 දිනට (රු.'000)
හිඟ හිටි සාමාජික මුදල්	6	10
කලින් ලද සාමාජික මුදල්	12	8
තොගය - ඉංග්‍රීසි භාෂා පොත්	60	50
ලී බඩු සහ සවිකිරීම් (ධාරණ වටිනාකම)	160	180
බැංකුවේ ඇති මුදල්	?	10

(iii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරන ලද සහ මුදලින් ගෙවූ වියදම්:

	රු.'000
ඉංග්‍රීසි භාෂා පොත් ගැනුම්	100
කාර්යාල කුලිය	60
ගිණුම් ලිපිකරුගේ වැටුප	60
කාර්යාල වියදම්	30

(iv) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයට රු. 200 000 ක පරිත්‍යාග ලැබී ඇත. පරිත්‍යාග, ඒවා ලැබූ වර්ෂයේ දී ම ආදායම් ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තියයි.

අවශ්‍යවන්නේ:

(1) 2011.04.01 දිනට සමුච්චිත අරමුදල

(2) 2012.03.31 දිනට බැංකුවේ ඇති මුදල

(3) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

(අ) (1) සිසුන් 100 දෙනෙකුගෙන් සමච්ඡේද මට්ටමට ළඟාවීමට නම්, එක සිසුවකුගෙන් අයකළ යුතු මුදල = රු 4500 **(ලකුණු 08)**

පෙර වැඩ (රු.) :			
ස්ථාවර පිරිවැය :			
බස් රථ සඳහා කුලී (රු 45,000 × 2)	=	90,000 (01)	
බැංකු ගිණුමෙන් ලද මුදල	=	(20,000) (01)	
		70,000	
සංචාරක නිවාස සඳහා (රු 20,000 × 4)	=	80,000 (01)	150,000
විචල්‍ය පිරිවැය :			
ආහාර (රු 600 × 3 × 100)	=	180,000 (02)	
වතුර බෝතල් (රු 200 × 3 × 100)	=	60,000 (02)	
අනෙකුත් වියදම් (රු 600 × 100)	=	60,000 (01)	300,000
අවශ්‍ය මුළු මුදල	=		450,000
එක් සිසුවෙකුගෙන් අය කල යුතු මුදල	=	රු. $\frac{450,000}{100}$	
	=	රු. 4500	

පෙර වැඩ (රු) :			
විකල්ප පිළිතුර			
100	=	150,000 (03)	
		(x - 3,000) (05)	
	=	4,500	

(අ) (2) පරිත්‍යාග කළ හැකි මුදල = රු 50,000 **(ලකුණු 02)**

පෙර වැඩ

(01) (01)

(රු 5000 - රු 4500) × 100

= රු 50,000

(ආ)(1) 2011/04/01 දිනට සමුච්චිත අරමුදල රු 242,000 **(ලකුණු 05)**

පෙර වැඩ	රු 000	
වත්කම් :		
හිඟහිටි සාමාජික මුදල	10	(01)
පොත්	50	(01)
ලීබඩු හා සවිකිරීම්	180	(01)
බැංකු ශේෂය	10	(01)
වගකීම් :		
කලින් ලද සාමාජික මුදල	8	(01)
සමුච්චිත අරමුදල	242	

(ආ) (2) 2012/3/31 දිනට බැංකුවේ ඇති මුදල = රු 68,000/- **(ලකුණු 06)**

පෙර වැඩ (රු '000) : ලැබීම් හා ගෙවීම් ගිණුම

ශේෂය ඉ/ගෙ	10	ගැනුම්-පොත්	100
පරිත්‍යාග	200 (01)	කාර්යාල වියදම්	60
සාමාජික මුදල් *	108 (03)	ගිණුම් ලිපිකරු වැටුප්	60
		කාර්යාල වියදම්	30
		ශේෂය ප/ගෙ	68
	318		318

(අනිකුත් අයිතම 2කට 1 බැගින් ලකුණු 02)

පෙර වැඩ (රු '000) : *සාමාජික මුදල් ගිණුම

ලැබිය යුතු සාමාජික මුදල	10	කලින් ලද සාමාජික මුදල	8
ආදායම් හා වියදම්	100	ලැබීම් හා ගෙවීම්	108
කලින් ලද සාමාජික මුදල	12	ලැබිය යුතු සාමාජික මුදල	6
	122		122

(අයිතම 2කට 1 බැගින් ලකුණු 03)


(ආ) (3)

උදාර සුභ සාධක සංගමය
2012/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් හා වියදම් ගිණුම (රු'000)

පොත් ගැනුම් වියදම	90 (02)	පරිත්‍යාග	200 (01)
කාර්යාල කුලී වියදම	60	සාමාජික මුදල්	100 (01)
ගිණුම් ලිපිකරු වැටුප්	60 (01)		
කාර්යාල වියදම	30		
ලීබඩු ක්ෂය	20 (02)		
අතිරික්තය	40 (02)	/ලද අගය (01)	
	300		300

(ලකුණු 09)


6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය
15 x 2 = ලකුණු 30කි.
6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 63%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.

ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 18%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලබාගත් පිරිස 18%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 23%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අනුකොටස් 5ක් ඇති අතර සෑම කොටසකම පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනුකොටස (අ) (1) වන අතර එහි පහසුතාව 48%කි. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වේ. එහි පහසුතාව 72% කි.

(අ) (1) හා (අ) (2) අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 48%ක් හා 57%ක් වේ. ප්‍රායෝගික අභ්‍යාසයකදී ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය වෙන්කර හඳුනා ගැනීමේ හැකියාව අඩුවීමත් වාණිජ සංගමයේ බැංකු ගිණුමේ ශේෂය ස්ථාවර පිරිවැයක් ලෙස හඳුනාගෙන තිබීමේ දුර්වලතා සහ විචල්‍ය පිරිවැය ගණනය කිරීමේදී චාරිකාවේ කාලය ගැන සැලකිලිමත් විය යුතු බව අවබෝධ කරගෙන නොතිබීමත් මීට හේතු වී ඇත. ස්ථාවර හා විචල්‍ය පිරිවැය හඳුනා ගැනීම සඳහා වැඩි වශයෙන් ප්‍රායෝගික අභ්‍යාසවල නිරතවීමට සිසුන් යොමු කළ යුතුය.

(ආ) (2) හා (ආ) (3) අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 60%ක් හා 49%ක් වේ. බැංකුවේ ඇති මුදල ගණනය කිරීමේදී සාමාජික මුදල් ගණනය කිරීමේදී ඇති වූ දෝෂය බලපා තිබූ අතර, උපචිත සංකල්පය පිළිබඳ දැනුම අඩුවීම නිසා වර්ෂයට අදාළ වියදම් ගණනය කිරීමට නොහැකිවී තිබුණි. තවද වර්ෂ සංසන්දනය කිරීමේදී නිවැරදි ආරම්භක හා අවසාන දින ගැන අවධානය නොකිරීම දක්නට ලැබුණි. අභ්‍යාසයේ වර්ෂ ඉදිරිපත් කර ඇති ආකාරය හොඳින් අවබෝධ කරගෙන ආරම්භක හා අවසාන දින හඳුනා ගැනීමට සිසුන් යොමු කළ යුතුය.

07 ප්‍රශ්නය

7. (අ) සමාගමක් විසින් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු සඳහා A යන්ත්‍රය හෝ B යන්ත්‍රය මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එක් එක් යන්ත්‍රය රු. 400 000 බැගින් මිලට ගත හැකිය. පහත තොරතුරු ද දී ඇත.

(i) අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලාඒම්

වසර	A යන්ත්‍රය (රු.'000)	B යන්ත්‍රය (රු.'000)
1	100	75
2	150	100
3	180	205
4	150	240

(ii) වසර හතර සඳහා අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලාඒම්වල වර්තමාන අගයවල එකතුව (10% වට්ටම් සාධකය මත)

	(රු.'000)
A යන්ත්‍රය	452
B යන්ත්‍රය	468

අවශ්‍යවන්නේ:

(1) එක් එක් යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය ගණනය කර එම ක්‍රමය මත මිල දී ගැනීමට වඩාත් සුදුසු කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න.

(2) එක් එක් යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය ගණනය කර එම ක්‍රමය මත මිල දී ගැනීමට වඩාත් සුදුසු කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න.

(3) ඉහත (1) සහ (2) ට ලැබෙන පිළිතුරු එකිනෙකට වෙනස් නම් සමාගම විසින් තෝරාගත යුත්තේ කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න. ***(ලකුණු 05 යි)***

(ආ) 2012.03.01 දිනට සීමිත අකලංක සමාගමේ ණයගැති ලෙජරයේ ශේෂවල එකතුව පහත පරිදි වේ.

ණයගැතියා	2012.03.01 දිනට ශේෂය (රු.'000)
අශෝක	100
සුනිමල්	150
සමනල	50
එකතුව	**300**

සමාගමේ මූලික පොත්වලින් උපුටාගත් 2012 මාර්තු මාසයේ සිදු වූ ණයට විකුණුම් සහ ආශ්‍රිත ගනුදෙනුවල විස්තර පහත පරිදි වේ. (සියලු ම වටිනාකම් රු.'000 වලින් දී ඇත.)

ණයගැතියා	විකුණුම්	ආපසු එවුම්	මුදල් ලැබීම්	දුන් වට්ටම්	බොල්ණය කපා හැරීම්
අසෝක	125	25	100	-	-
කුමාර	120	20	-	-	-
සුනිමල්	90	-	50	-	-
කමල්	265	-	135	20	-
සමනල	-	-	-	-	50
එකතුව	**600**	**45**	**285**	**20**	**50**

2012.03.01 දිනට ණයගැති ලෙජර් ශේෂවල එකතුව ණයගැති පාලන ගිණුමේ ශේෂයට එකහ විය. නමුත් 2012.03.31 දිනට මෙම ශේෂ දෙක එකහ නොවීය. පසුව කරන ලද විමර්ශනවලින් ණයගැති පාලන ගිණුම නිවැරදි ව පිළියෙල කර ඇති බව අනාවරණය වූ නමුත් ගනුදෙනු ණයගැති ලෙජරයේ සටහන් කිරීමේ දී පහත වැරදි සිදුවී ඇත.

(i) අසෝක විසින් නැවත එවන ලද භාණ්ඩ සටහන් වී නොමැත.

(ii) සුනිමල්ට කරන ලද විකුණුම් සටහන් වී ඇත්තේ විකුණන ලද භාණ්ඩවල ලැයිස්තුගත මිලට ය. (මෙම භාණ්ඩවල ලැයිස්තුගත මිල රු. 100 000 කි.)

(iii) සමනලගේ ආරම්භක ශේෂය බොල්ණය ලෙස කපා හැරීම සටහන් වී නොමැත.

මාසය අවසානයේ ණයගැති ශේෂය මත 10% ක අඩමාන ණය සඳහා වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කපාහරින ලද බොල්ණය සටහන් කරනුයේ ද අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුම තුළිනි.

අවශ්‍යවන්නේ:

(1) 2012 මාර්තු මාසය සඳහා ණයගැති පාලන ගිණුම සහ අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුම
(2) ඉහත දී ඇති වැරදි නිවැරදි කිරීමට පෙර 2012.03.31 දිනට ණයගැති ලෙජර ශේෂවල එකතුව

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

* * *

7. (අ) (1) A = වර්ෂ 02 මාස 10 (01)
B = වර්ෂ 03 මාස 01 (01)

A යන්ත්‍රය මිලදී ගැනීම වඩා යෝග්‍ය වේ. (01)
හේතුව : A යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය අඩුවීමය. (01)

(අ) (2) A = 452 - 400 = 52 (01)
B = 468 - 400 = 68 (01)

B යන්ත්‍රය මිල දී ගැනීම වඩා යෝග්‍ය වේ. (01)
හේතුව :
B යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය ඉහළ ධන අගයක් ගැනීමය. (01)

(අ) (3) B යන්ත්‍රය මිල දී ගැනීම යෝග්‍ය වේ.
මුදලේ කාලීන වටිනාකම සැලකිල්ලට ගෙන ශුද්ධ වර්තමාන අගය ඉහළ අගයක් ගන්නා බැවින්ය. (02)

විකල්පය
A යන්ත්‍රය මිල දී ගැනීම යෝග්‍ය වේ.
පිළිගෙවුම් කාලය අඩු බැවින් ඉක්මණින් යෙදූ මුදල් ව්‍යාපාරයට ලැබේ. **(ලකුණු 10)**

(ආ)(1)

ණයගැති පාලන ගිණුම (රු '000)

ශේෂය ඉ/ගෙ	300 (01)	ආපසු එවුම්	45 (01)
විකුණුම්	600 (01)	මුදල්	285 (01)
		දුන් වට්ටම්	20 (01)
		බොල් ණය	50 (01)
		ශේෂය ප/ගෙ	500 (01)
	900		900
ශේෂය ඉ/ගෙ	500		

අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම

ණයගැති පාලන	50 (01)	ශේෂය ඉ/ගෙ	30 (01)
ශේෂය ප/ගෙ	50 (01)	බොල් හා අඩමාන ගිණුම	70 (02)
	100		100
		ශේෂය ඉ/ගෙ	50

(ලකුණු 12)

(ආ) (2) ණයගැති ලෙජර ශේෂ එකතුව (වැරදි නිවැරදි කිරීමට පෙර)


(රු 000) 585 **(ලකුණු 08)**

පෙර වැඩ :	රු '000	
2012.03.31 දිනට පාලන ගිණුමේ ශේෂය	(02) 500	
එකතු කලා		
සටහන් නොවූ ආපසු එවුම්	25	(02)
ලැයිස්තු ගත මිලට අනුව විකුණුම් ගැලපීම්	10	(02)
කපා නොහැරුණු බොල් ණය	50	(02)
2012.03.31 දිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව	585	


විකල්පය

පෙර වැඩ :	රු '000	
අසෝක	125	(02)
සුනිමල්	200	(02)
කමල්	110	(01)
සමනල	50	(02)
කුමාර	100	(01)
2012.03.31 දිනට ණයගැති ශේෂය ලැයිස්තුවේ එකතුව	585	

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 75%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 25%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 23%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අනුකොටස් 5ක් ඇත. එම සියලුම අනුකොටස්වල පහසුතාව 55%ට වඩා වැඩිය. පහසුතාව වැඩිම අනුකොටස (අ) (1) වන අතර එහි පහසුතාව 64%කි. (අ) (2) සහ (ආ) (2) යන අනුකොටස් දෙකේම පහසුතාව 56% බැගින් වේ.

(අ) (2) අනුකොටස සඳහා පහසුතාව 56%කි. ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමට අවශ්‍ය වන මුදල් ගලා ඒම හා මුදල් ගලායෑම්වල වර්තමාන අගයන් පිළිබඳ ව අවබෝධය සිසුන් තුළ අඩුය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් දෙන ලද තොරතුරුවල ස්වභාවය අනුව අභ්‍යාස විසඳීමට සිසුන් ප්‍රගුණ කළ යුතුය.

(ආ) (1) හා (ආ) (2) අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 62%ක් හා 56%ක් වේ. අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම තුළින් බොල් හා අඩමාන ණය වාර්තා කිරීම සම්බන්ධව තිබූ අවබෝධය ප්‍රමාණවත් නොවන අතර දෙන ලද තොරතුරු තුළින් ණයගැති පාලන ගිණුම සැකසීමට අවබෝධයක් තිබුණ ද පාලන ගිණුම තුළින් ලබාගත් ශේෂය මුල් කරගෙන ණයගැති ලෙජර ශේෂවල පැවති එකතුව සෙවීම පිළිබඳ අවබෝධය දුර්වලය. අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම තුළින් බොල්ණය සම්බන්ධ ගැළපීම් සටහන් කිරීම පිළිබඳ සිසුවාට අවබෝධයක් ලැබෙන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. පාලන ගිණුමේ ශේෂය සහ ශේෂ ලැයිස්තුවේ, ශේෂය සංසන්දනය කිරීම සහ එහි අවශ්‍යතාව ගැන අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



II ප්‍රශ්න පත්‍රයේ 4 වන ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්නවල පහසුතා 50% හෝ ඊට වැඩිය.

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අතරින් 76%ක වැඩිම පහසුතාවක් 3 වන ප්‍රශ්නයට දක්වා ඇති අතර 49%ක අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 4 වන ප්‍රශ්නයටය.

පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වේ. මෙම ප්‍රශ්න දෙක අතරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ දෙවන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 60%කි.

තුන්වන ප්‍රශ්නයේ සිට හත්වන ප්‍රශ්නය තෙක් තෝරා ගන්නා ප්‍රශ්න වන අතර එයින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 3 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 76%කි. ප්‍රශ්න තෝරා ගැනීමේ දී වැඩිම පිරිසක් තෝරාගෙන ඇත්තේ ද 3 වන ප්‍රශ්නය වේ (පිටු අංක 06හි ප්‍රස්තාරය ඇසුරින්). II ප්‍රශ්න පත්‍රයේ තෝරා ගන්නා ප්‍රශ්නවලින් අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 4 වන ප්‍රශ්නය වන අතර එය 49%කි. තෝරා ගන්නා ප්‍රශ්න අතරින් දෙවනුවට වැඩිම පිරිසක් තෝරාගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නය වේ.

5, 6, 7 යන ප්‍රශ්න අතරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 7 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 60%කි. 5 සහ 6 ප්‍රශ්න පිළිවෙළින් 52%ක් හා 55%ක පහසුතා දක්වා ඇති අතර 5, 6, 7 යන ප්‍රශ්න අතරින් වැඩිම පිරිස තෝරාගෙන ඇත්තේ 7 වන ප්‍රශ්නය වේ.

III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් ප්‍රශ්න පත්‍රය කොටස් කීපයකින් යුක්ත වන්නේ නම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
* I පත්‍රයේ ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතු ය. ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා වඩාත් සුදුසු පිළිතුර පමණක් හිස් තැන තුළ ලියන්න.
* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.
* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.
* ප්‍රශ්න අංක හා අනුකොටස් නිවැරදි ව ලිවිය යුතු ය.
* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.
* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.
* II වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේදී ප්‍රධාන ප්‍රශ්නය යටතේ ඇති අනුකොටස් සියල්ල හොඳින් කියවා බලා එක් එක් අනුකොටසට අදාළ ඉලක්ක ගත පිළිතුර පමණක් ලිවිය යුතු ය.
* ගැටලුවලට පිළිතුරු සැපයීමේ දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.
* පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පැන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
* ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාල කළමනාකරණය කරගත යුතුය.

විශේෂ උපදෙස් :

1. ප්‍රශ්නවලට අදාළ පිළිතුර පියවරෙන් පියවර ඉදිරිපත් කළ යුතුය.
2. ප්‍රශ්න විසඳීමේ දී දහස් සංඛ්‍යාවලින් ඉදිරිපත් කරන්නේ නම් සියලු සංඛ්‍යා දහස්වලින් බව දැක්විය යුතුය. (එනම් රු'000)
3. එක් එක් ප්‍රශ්නයට අදාළ පෙර වැඩ ඒ ඒ පිළිතුර සමග ඉදිරිපත් කළ යුතුය.
4. ප්‍රශ්නයක අනුකොටස් ඇති විටක දී පිළිතුරු නියමිත අනුකොටස් අංක සඳහන් කරමින් ඉදිරිපත් කළ යුතුය.
5. ප්‍රශ්නයක අනුකොටස් ඇතිවිටක එහි පිළිතුරු සෑම තැනකම විසුරුවා හැරීම නොකළ යුතුය.
6. ඉලක්කම් ලිවීමේදී පැහැදිලි ව ලිවිය යුතුය.
7. තමා ලද පිළිතුර භාවිත කරමින් සම්පූර්ණ පිළිතුර සැපයිය යුතුය.

3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, උසස් පෙළට නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිත, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පළකර ඇති
  (1) ගිණුම්කරණ ප්‍රමිත සහ සමාගම් ගිණුම්කරණය
  (2) පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය
  පිළිබඳ ව ගුරුභවතුන් මෙන්ම සිසුන් ද දැනුවත් වීම හා භාවිතය අවශ්‍යය.

* ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ලැබෙන ගැටළු විසඳීම සාර්ථකව සිදුකිරීමට නම් පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතුවලදී ව්‍යාපාර ලෝකයේ ප්‍රායෝගික ගැටළු මුල් කරගෙන අභ්‍යාස සකස් කර ලබාදීම අවශ්‍යය.

* සාක්ෂරතාවයේ අඩුපාඩු හේතුවෙන් ප්‍රශ්න අවබෝධ කරගැනීමේ ගැටළු සහ ප්‍රකාශන හැකියාවේ ගැටළු අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

* ප්‍රායෝගිකව ව්‍යාපාර ලෝකය භාවිත කරන මූලාශ්‍ර ලියවිලි හා ගිණුම් වාර්තා පන්ති කාමර ආධාරක ලෙස භාවිතා කරමින් විෂය සංවර්ධනය කිරීමට අවශ්‍ය අත්දැකීම් තහවුරු කිරීමට මග සැලැස්වීම අවශ්‍යය.
  නිදසුන් - මූලාශ්‍ර ලියවිලි
  - බැංකු ප්‍රකාශන
  - වැටුප් ලේඛන
  - තොග වාර්තා
  - වාර්ෂික වාර්තාව

* මෙම විෂය තමාට මෙන්ම සමාජයට ද එකසේ වැදගත් විෂයයක් වන බැවින් හැමවිටම ඉගෙනුම් ක්‍රියාවලිය අවබෝධයෙන්, තර්කානුකූලව මනසට රසවත් වන පරිදි විෂය ඒකක ඉගෙන ගත යුතු බවත්, එක් එක් ඒකකය ඉගෙන ගත යුත්තේ මන්ද යන්න දරුවාගේ මනසට අවධාරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමත් කළ යුතුය.

* මෙම විෂය තීරණ ගැනීම සඳහා වැදගත් වන විෂයයක් වන බැවින් විෂයයේ සෑම ඒකකයක් සඳහා ම ඉගෙනුම් උපකරණ හා මෙවලම් භාවිතා කිරීම තුළින් ප්‍රබෝධක ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමට හා කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබාදීම යෝග්‍යය.

* නව විෂය දැනුම සංවර්ධනය කර ගැනීම හා යාවත්කාලීන කරගැනීමට නිරන්තරයෙන් කටයුතු කරන ගුරුභවතුන් කුසලතා පූර්ණ නිර්මාණශීලී පුද්ගලයන් වන අතර ඔවුන් මතු පරපුරට ද මහඟු දායාදයන්ය.